# කාර්ය සාධන වාර්තාව
# 2023




# ශ්‍රී ලංකා පොලීසිය

CM 040410 - 25 (2024/06) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ශ්‍රී ලංකා පොලීසිය

# වැය ශීර්ෂ අංකය - 225

අන්තර්ගතය


පරිච්ඡේදය 01 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 අනුකූලතා වාර්තාව

# පටුන

පිටු අංකය


පරිච්ඡේදය 01 ..... 1

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ..... 1
1.1 හැඳින්වීම ..... 1
1.2 ආයතනයේ දැක්ම මෙහෙවර ..... 3
1.3 ප්‍රධාන කාර්යයන් ..... 4
1.4 සංවිධාන සටහන ..... 5
1.5 ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන අංශ ..... 6
**1.5.1 ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය** ..... 6
**1.5.2 ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ව්‍යුහය** ..... 7
**1.5.3 විශේෂ කාර්ය බළකායේ ව්‍යුහය** ..... 8
1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත / අරමුදල් ..... 9
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ..... 9
පරිච්ඡේදය 02 ..... 10
ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 10
**ප්‍රගතිය - 2023** ..... 10
2.1 අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, සුරාබදු හා වෙනත් වැරදි ..... 10
2.1.1. බල අපරාධ ..... 10
2.1.1.(අ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ ..... 13
2.1.1.(ආ) ළමයින්ට එරෙහි බල අපරාධ ..... 15
2.1.1(ඇ) ශරීරය පිළිබඳ වැරදි ..... 17
2.1.1(ඈ) දේපළ පිළිබඳ වැරදි ..... 18
2.1.1(ඉ) ගොදුරු විරහිත වැරදි ..... 19
2.1.2 සුළු අපරාධ ..... 20
2.1.2 (අ) පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ ..... 20
2.1.2 (ආ) කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ ..... 22
2.1.2 (ඇ) ළමා හා කාන්තා හිංසනය සහ අපරාධ නිවාරණ වැඩසටහන් ..... 26
2.1.2 (ඈ) දේපළ වලට එරෙහි සුළු අපරාධ ..... 26
2.1.3 මත්ද්‍රව්‍ය අපරාධ ..... 29
2.1.4 සුරාබදු වැරදි ..... 32
2.1.5 ව්‍යවස්ථාපිත වැරදි ..... 35
2.1.6 දූරාචාරය සම්බන්ධ දූෂණ වැරදි ..... 37
2.1.7 අපරාධ විමර්ශනය සහ නිවාරණ කාර්යයෙහිලා ඇඟිලි සටහන් සහ නව තාක්ෂණික ක්‍රමවේදයන්හි දායකත්වය ..... 38
2.2 පොලිස් විශේෂ කාර්ය බලකා වැටලීම් ..... 39
2.3 විවිධ පැමිණිලි ..... 41
2.4 රිය අනතුරු ..... 42
2.4.1 අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු ..... 43
2.4.2 රිය අනතුරු වැළැක්වීමේ ක්‍රියාමාර්ග ..... 43
2.4.3 රථවාහන වැරදි සඳහා දඩපත් මගින් හා අධිකරණයෙන් උපයා දෙනලද ආදායම ..... 44
2.5 වෙනත් මහජන සේවාවන් ..... 45
2.5.1 මහජන පැමිණිළි විසඳීමේ විශේෂිත සේවා ..... 45
2.5.1(අ) 119 හදිසි ඇමතුම් සේවාව ..... 46
2.5.2 නිෂ්කාශන වාර්තා ..... 46
2.5.3 ප්‍රජා පොලිස් සේවය ..... 47
2.5.4 මහජන සාමය කළමනාකරණය ..... 48
2.6. පොලිස් වෛද්‍ය සේවාව ..... 48
2.6.1 පොලිස් නිලධරයන්ගේ මරණ ..... 49

2.7 බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරු කිරීම්. ..... 49
2.8 භෞතික සම්පත් සංවර්ධනය. ..... 52
2.8.1 ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම්. ..... 52
2.8.2 පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස හා මුරකුටි ආරම්භ කිරීම. ..... 53
2.8.2(අ) පොලිස් ස්ථාන ශ්‍රේණිගත කිරීම්. ..... 53
2.8.3 ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන. ..... 54
2.8.4 වෙනත් භෞතික සම්පත්. ..... 56
2.8.5 ඉඩම් සහ ගොඩනැගිලි පරිහරණය. ..... 57
2.8.6 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ ප්‍රගතිය. ..... 58
2.9 ශ්‍රී ලංකා පොලීසියේ ඉදිරි ඉලක්ක. ..... 59
2.9.1 අපරාධ විමර්ශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ඉදිරි ඉලක්ක. ..... 59
2.9.2 රිය අනතුරු වැලැක්වීම සම්බන්ධ ඉදිරි ඉලක්ක. ..... 60
2.9.3 මානව සම්පත් සංවර්ධනය සම්බන්ධ ඉදිරි ඉලක්ක. ..... 60
2.9.4 භෞතික සම්පත් සංවර්ධන ඉලක්ක. ..... 61
2.9.5 නව තාක්ෂණය භාවිත කිරීමේ ඉදිරි ඉලක්ක. ..... 63
පරිච්ඡේදය 03 ..... 64
වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය ..... 64
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... 64
3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 65
3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... 66
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් ..... 67
3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ..... 67
3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ..... 67
3.8 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ..... 68
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ..... 68
3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව ..... 69
පරිච්ඡේදය 04 ..... 86
කාර්ය සාධන දර්ශක ..... 86
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ..... 86
පරිච්ඡේදය 05 ..... 87
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..... 87
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ..... 87
පරිච්ඡේදය 06 ..... 92
මානව සම්පත් පැතිකඩ ..... 92
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ..... 92
6.2 ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය. ..... 95
6.3 මානව සම්පත් සංවර්ධනය ..... 95
පරිච්ඡේදය 07 ..... 101
7.1 අනුකූලතා වාර්තාව ..... 101

**පරිච්ඡේදය 01**

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

1865 අංක 16 දරන පොලිස් ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේදී මහජනතාවට වඩාත් සංවිධානාත්මක සේවාවක් ලබා දීමේ අරමුණින් පොලිස් සේවාව 1866 සැප්තැම්බර් මස 03 වන දින ආරම්භ කරන ලදී. එදා සිට මේ දක්වා වසර 157 කට අධික කාලයක් ශ්‍රී ලංකා පොලීසිය "රටේ නීතිය හා සාමය" සුරක්ෂිත කොට පවත්වාගෙන යාමේ භාරදූර වගකීම ඉටු කරමින් සිටී.

ජන ජීවිතයේ සෑම අංශයකම ආරක්ෂාව සහතික කරමින් සමාජයේ සුරක්ෂිත භාවය තහවුරු කිරීමේ පෘථුල වගකීම ශ්‍රී ලංකා පොලීසිය වෙත පැවරී ඇත. සමාජ සාමය සහ යහ පැවැත්ම සඳහා පාදක වන අපරාධ මර්දනය හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්දනය. රථ වාහන පාලනය, පරිසර ආරක්ෂණය, ආපදා අවස්ථාවන්හිදී ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්ෂාව යන ප්‍රධාන කාර්ය භාරයන් පොලීසියේ විෂය පථයට අදාළ වේ. මීට අමතරව නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම මෙන්ම මහජනයාට ඉතා සමීපව සම්බන්ධ වන 119 හදිසි ඇමතුම් සේවාව ඔස්සේ මහජන පැමිණිලි වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ සේවාව ක්‍රියාත්මක වන අතර, එමගින් ජනතාව වෙත පොලීසියේ සේවාවන් ඉතා ඉක්මනින් ලබා ගැනීමේ ඉඩකඩ පුළුල් කර ඇත.

ඉතා විධිමත්ව සැකසුණු නිල ධූරාවලියකින් සැදුම්ලත් ශ්‍රී ලංකා පොලීසිය සිය සංවිධානාත්මක ව්‍යුහය මගින් ආයතනයේ ක්‍රියාකාරීත්වය මනා සහසම්බන්ධතාවයකින් යුක්තව ඔප් නංවා ඇත.

සංවිධානාත්මක ව්‍යුහයේ ඉහළින්ම ක්‍රියාත්මක වන තනතුර වන පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ව්‍යුහයේ අනෙකුත් තනතුරු ක්‍රියාත්මක වන අතර, ඒ අනුව පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී, ප්‍රධාන පොලිස් පරීක්ෂක, පොලිස් පරීක්ෂක, උප පොලිස් පරීක්ෂක, මහ සැරයන්, පොලිස් සැරයන්, පොලිස් සැරයන් රියදුරු, පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියදුරු ලෙස නිල ධූරාවලිය ඉහල සිට පහළට ක්‍රියාත්මක වේ.

මෙම නිල ධූරාවලිය ආයතනගත ව්‍යුහයක් මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ව්‍යුහය ප්‍රධාන වශයෙන් ජනතාව සමග සෘජුවම සම්බන්ධ වන ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස සහ එම ප්‍රාදේශීය කොට්ඨාස වල රාජකාරී සඳහා පරිපාලනමය හා සහයෝගාත්මක සේවාවන් සපයනු ලබන ක්‍රියාකාරී කොට්ඨාස ලෙස වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.

ප්‍රාදේශීය කොට්ඨාස ව්‍යුහයේ ඉහළින්ම පළාත් නියෝජනය වන අතර, එහි කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ ක්‍රියාත්මක වේ. පළාතට අයත් සෑම දිස්ත්‍රික්කයක් භාරවම නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කර ඇති අතර, ඔහු යටතේ පවතින දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස කිහිපයකට බෙදා පාලනය කෙරේ. එබඳු ප්‍රාදේශීය පොලිස් කොට්ඨාසයක් භාරව කොට්ඨාස භාර නිලධාරී ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරයකු හෝ පොලිස් අධිකාරී වරයකු පත් කර ඇති අතර, එබඳු ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස 45 ක් දිවයින තුළ ක්‍රියාත්මක වේ. එම ප්‍රාදේශීය පොලිස් කොට්ඨාසයක් පොලිස් දිස්ත්‍රික්ක කිහිපයකට බෙදා එම දිස්ත්‍රික්කයක් සහකාර පොලිස් අධිකාරී වරයකු යටතට පත් කොට ඇති අතර, එබඳු පොලිස් දිස්ත්‍රික්කයකට පොලිස් ස්ථාන කිහිපයක් ඇතුළත් කොට ඇත. මෙවැනි පොලිස් දිස්ත්‍රික්ක 196 ක් දිවයින තුළ පිහිටා ඇති අතර, 2023.12.31 දිනට එම පොලිස් දිස්ත්‍රික්ක වලට අයත් පොලිස් ස්ථාන 607 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

සියළු පොලිස් ස්ථාන, මූලස්ථාන පොලිස් ස්ථාන හා සාමාන්‍ය පොලිස් ස්ථාන ලෙස වර්ග කොට සෑම පොලිස් ස්ථානයක්ම විවිධ මට්ටම් යටතේ ශ්‍රේණිගත කොට ඇත. ඒ අනුව A1 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 82 ක්ද, A2 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 103 ක්ද, A3 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 142 ක්ද, B ශ්‍රේණියේ පොලිස් ස්ථාන 152 ක්ද, C ශ්‍රේණියේ පොලිස් ස්ථාන 74 ක්, සහ D ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 54 ක්ද ලෙස 2023.12.31 දිනට එම පොලිස් ස්ථාන 607 ශ්‍රේණිගත කර ඇත. මූලස්ථාන පොලිස් ස්ථානයක් භාරව ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු සහ අනෙකුත් පොලිස් ස්ථාන භාරව

ස්ථානාධිපති වරයෙකු ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු හෝ පොලිස් පරීක්ෂකවරයෙකු පත්කොට ඇති අතර ඔවුන් විසින් තමන් යටතේ සේවය කරන පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් සැරයන්වරුන් සහ පොලිස් කොස්තාපල්වරුන් මගින් සෘජුවම මහ ජනතාව වෙත පොලිසියේ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

පොලීසියේ කාර්යභාරයට අදාල විවිධ විෂයයන් සම්බන්ධයෙන් ද නිල ධූරාවලියක් ක්‍රියාත්මක වේ. ඒ අනුව අපරාධ, මත්ද්‍රව්‍යය අපරාධ, රථ වාහන, ප්‍රභූ ආරක්ෂාව, විශේෂකාර්ය බලකාය, සහායක සේවා, ප්‍රවර්තන ආදී විෂයයන් භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන් පත්කොට ඇති අතර ඔවුන් යටතේ දිසාවන් ලෙස විෂයයන් එකක් හෝ කිහිපයක් එක් කොට එබඳු දිසාවක් භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත් කර ඇත. එම දිසාවන් යටතට ගැනෙන ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස 78 ක් 2023.12.31 දින වන විට ක්‍රියාත්මකව පවතින අතර එම කොට්ඨාස භාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු හෝ පොලිස් අධිකාරීවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කොට අදාළ කොට්ඨාසයේ පරිපාලන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

ශ්‍රී ලංකා පොලීසිය සතු විශේෂිත අංශයක් වන විශේෂ කාර්ය බලකාය ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන කොට්ඨාසයකි. විවිධ වැටලීම් මගින් ඉතා වැදගත් මෙන්ම කාර්යක්ෂම සේවයක් ලබා දෙමින් ශ්‍රී ලංකා පොලීසිය වෙත ඔවුන්ගේ දායකත්වය හිමි වන අතර විශේෂ කාර්ය බලකාය සතු නිලධරයන් සංඛ්‍යාව 8444 කි.

පොලිස් රාජකාරී සඳහා අවශ්‍ය විවිධ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා සහායක සේවාවක් ද, ක්‍රියාත්මකව පවතින අතර ඒ යටතේ වෛද්‍ය, ඉංජිනේරු, සූපවේදී, කාර්මික, තොරතුරු තාක්ෂණය වැනි විශේෂිත සේවාවන් සඳහා 1180 ට ආසන්න නිලධරයන් සංඛ්‍යාවක් සුවිශේෂී රාජකාරියක නියැලි සිටී. මීට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්, සැලසුම් සේවයේ නිලධරයන් සහ රජයේ විවිධ සේවාවන්ට අයත් ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, භාෂා පරිවර්ථක, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක වැනි දෙපාර්තමේන්තුගත නොවන තනතුරු වලට අයත් නිලධරයන් සහ අපරාධ විද්‍යාඥ, පර්යේෂණ නිලධාරී, සංවර්ධන සහකාර නිලධාරී සහ විවිධ කම්කරු වෘත්තීන්ට අයත් දෙපාර්තමේන්තුගත නිලධරයන්ද ඇතුළත් සිවිල් කාර්යමණ්ඩල නිලධරයන් 6460 දෙනෙකු පොලිස් රාජකාරී සඳහා සුවිශේෂී සහයක් ලබා දෙමින් සේවයේ යෙදී සිටී.

## 1.2 ආයතනයේ දැක්ම මෙහෙවර



**දැක්ම**

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.


**මෙහෙවර**

සැමට සමාන,
කිසිවෙකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලීසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම
- අපරාධ පාලනය හා වැළැක්වීම
- අපරාධ විමර්ශනය හා නඩු මෙහෙයවීම
- මාර්ග ආරක්ෂාව හා රථ වාහන පාලනය
- ප්‍රභූ ආරක්ෂාව
- පරිසර ආරක්ෂණ කටයුතු සහ ආපදා අවස්ථාවන්හි දී අදාළ අංශ වෙත සහාය ලබා දීම
- කැරළි හා දූෂණ මර්දන සහ විවිධ පැමිණිලි විසඳීම
- පොලිස් නිෂ්කාශන හා පසුබිම් වාර්තා අදාළ අංශ සහ පුද්ගලයින් වෙත නිකුත් කිරීම


# 1.4 සංවිධාන සටහන


පොලිස්පති
ක්‍රියාකාරී කොට්ඨාස
ප්‍රාදේශීය කොට්ඨාස
ජ්‍යෙ.නි.පො.ප. පරිපාලන
නි.පො.ප. පොලිස් මූලස්ථානය
නි.පො.ප. ජනාධිපති ආරක්ෂක දිසාව
නි.පො.ප. අගමැති ආරක්ෂක දිසාව
නි.පො.ප. විශේෂ ආරක්ෂක දිසාව
නි.පො.ප. පර්යේෂණ සංවර්ධන හා කොරතුරු තාක්ෂණ දිසාව
අධ්‍යක්ෂ සිවිල් පරිපාලන
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී ලංකා පොලිසිය
ජ්‍යෙ.නි.පො.ප. අපරාධ හා රථවාහන.
නි.පො.ප. අපරාධ
නි.පො.ප. මත්ද්‍රව්‍ය
නි.පො.ප. රථවාහන
ජ්‍යෙ.නි.පො.ප. සහායක සේවා
නි.පො.ප. ප්‍රවර්ථන
නි.පො.ප. ප්‍රවාහන හා සංදේශ
නි.පො.ප. ක්ෂේත්‍ර බලකාය මූලස්ථානය
නි.පො.ප. සුබසාධන
ජ්‍යෙ.නි.පො.ප. පුහුණු හා උසස් පුහුණු
නි.පො.ප. ශිෂ්‍යාභට
නි.පො.ප. පුහුණු
විධායක අධ්‍යක්ෂ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය
ජ්‍යෙ.නි.පො.ප. සංචාරක හා ආයෝජන
නි.පො.ප. ප්‍රජා පොලිස් හා පරිසර
නි.පො.ප. නාවික හා සංචාරක
ජ්‍යෙ.නි.පො.ප ළමා හා කාන්තා කටයුතු
නි.පො.ප. ළමා හා කාන්තා
ජ්‍යෙ.නි.පො.ප .විශේෂ කාර්ය බළකාය
නි.පො.ප. පාලන
නි.පො.ප. මෙහෙයුම්
නි.පො.ප. මාණ්ඩලික
නි.පො.ප. නීති
නි.පො.ප. විශේෂ කාර්යාංශය
නි.පො.ප අපරාධ පරීක්ෂණ දෙ.
නි.පො.ප. මානව සම්පත්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ද්විතීයනය කිරීම්
1. නි.පො.ප. රාජ්‍ය බුද්ධි
2. නි.පො.ප. රාජ්‍ය බුද්ධි
3. නි.පො.ප. රාජ්‍ය බුද්ධි
4. නි.පො.ප. අල්ලස් දූෂණ
ජ්‍යෙ.නි. පො.ප. බස්නාහිර
නි.පො.ප. කොළඹ
නි.පො.ප. බස්නාහිර උතුර
නි.පො.ප. බස්නාහිර දකුණ
නි.පො.ප. කළුතර
නි.පො.ප. බස්නාහිර පළාත් රථවාහන
ජ්‍යෙ.නි. පො.ප. දකුණ
නි.පො.ප. ගාල්ල
නි.පො.ප. මාතර හම්බන්තොට
ජ්‍යෙ.නි. පො.ප. ස
නි.පො.ප. රත්නපුර
නි.පො.ප. කෑගල්ල
ජ්‍යෙ.නි. පො.ප. උතුරු මැද
නි.පො.ප. අනුරාධපුර
නි.පො.ප. පොළොන්නරුව
නි.පො.ප. කැබිතිගොල්ලෑව
ජ්‍යෙ.නි. පො.ප. උතුර
නි.පො.ප. බදුල්ල
නි.පො.ප. මොණරාගල
ජ්‍යෙ.නි. පො.ප. නැගෙනහිර
නි.පො.ප. ත්‍රිකුණාමලය
නි.පො.ප. අම්පාර
නි.පො.ප. මඩකලපුව
ජ්‍යෙ.නි. පො.ප. මධ්‍යම
නි.පො.ප. මහනුවර
නි.පො.ප. නුවරඑළිය
ජ්‍යෙ.නි. පො.ප. වයඹ
නි.පො.ප. කුරුණෑගල
නි.පො.ප. පුත්තලම
ජ්‍යෙ.නි. පො. උතුර
නි.පො.ප. යාපනය
නි.පො.ප. කිලිනොච්චිය
නි.පො.ප. වව්නි

# 1.5 ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන අංශ


## 1.5.1 ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය

(2023.12.31 දිනට ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ප්‍රමාණය 45 කි )




## 1.5.2 ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ව්‍යූහය

2023.12.31 දිනට ක්‍රියාකාරී කොට්ඨාස ප්‍රමාණය 78 කි. (2023.12.31 දිනට ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ප්‍රමාණය 78 කි.)



### 1.5.3 විශේෂ කාර්ය බළකායේ ව්‍යුහය



## 1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත / අරමුදල්

| වගු අංක 01 | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පවතින ආයතනගත අරමුදල් | |
|---|---|---|
| අනු අංකය | අරමුදලෙහි නම | 2023.12.31වන දිනට ශේෂය (රුපියල්) |
| 1 | පොලිස් ත්‍යාග අරමුදල | 119,680,354.55 |
| 2 | පොලිස් අනුග්‍රහ අරමුදල | 43,220.43 |
| 3 | පොලිස් සෞඛ්‍ය සුභසාධක යෝජනා ක්‍රමය | 114,562180.72 |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී මුදල්**

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| වගු අංක 02 | විදේශ ආධාර ලබන ව්‍යාපෘති | |
|---|---|---|
| 1 | **අ) ව්‍යාපෘතියේ නම** | ඔස්ට්‍රේලියන් ෙඩරල් පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද Establishing Canine Welfare And Best Kennel Management Practices පාඨමාලාව |
| | **ආ) දායක නියෝජිතායතනය** | ඔස්ට්‍රේලියන් ෙඩරල් පොලීසිය |
| | **ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම** | ලබා දී නැත |
| | **ඈ) ව්‍යාපෘති කාල සීමාව** | 2023.05.24 දින සිට 2023.06.02 දක්වා දින 10 ක් |
| | | |
| 2 | **අ) ව්‍යාපෘතියේ නම** | China Grant |
| | **ආ) දායක නියෝජිතායතනය** | Hytera Communication Cooperation limited |
| | **ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම** | චීන රජයේ ආධාර |
| | **ඈ) ව්‍යාපෘති කාල සීමාව** | නව සන්නිවේදන ජාලය ස්ථාපිත කර වසර 03 ක වගකීම් කාලයකට යටත්ව 2023.12.21 දින විශේෂ කාර්ය බළකායට භාර ගැනීමට කටයුතු කර ඇත. |
| | | |
| 3 | **අ) ව්‍යාපෘතියේ නම** | මැග් ආයතනය විසින් කොටියාසය වෙත අවි ගබඩාවක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා කන්ටේනර් පෙට්ටියක් නවීකරණය කර ප්‍රදානය කිරීම |
| | **ආ) දායක නියෝජිතායතනය** | Mines Advisory Group, No.242, Mannar Road, Nelukkulam, Vavuniya. |
| | **ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම** | මෙම අවි ගබඩාව ප්‍රධානයක් වශයෙන් ලබා දී ඇති අතර, ඇස්තමේන්තුවක් නොමැත. |
| | **ඈ) ව්‍යාපෘති කාල සීමාව** | 2022.07.07 - 2023.01.10 |

## පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය - 2023

### 2.1 අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, සුරාබදු හා වෙනත් වැරදි

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ, විමර්ශන කාර්යයන් සඳහා මූළිකවම බරපතල ගණයේ සහ බරපතල නොවන ගණයේ අපරාධ ලෙස වර්ග කෙරේ. මෙම බරපතල ගණයේ අපරාධ බල අපරාධ නැතහොත් ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර, එබඳු අපරාධ කාණ්ඩ 26 කට ඇතුළත් කොට ඇත.
බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර, ඒවා පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙසද බෙදා දක්වනු ලැබේ.

තවද මෙම පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ විග්‍රහයට බඳුන් කෙරෙන අතර, එමගින් හෙරොයින් ඇතුළු නිද්‍රාජනක ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම සුරාබදු වැරදි යටතේ නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැරදි ඇතුළත් කර ඇති අතර, විවිධ ව්‍යවස්ථාපිත පනත් මගින් තහනම් කරන ලද වැරදි සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන දුරාචාර ක්ෂේත්‍රයට අයත් දූෂණ වැරදිද මෙම පරිච්ඡේදය මගින් දක්වා ඇත.

### 2.1.1 බල අපරාධ

බල අපරාධ යනු දරුණු ගනයේ අපරාධයි. පෙර කී පරිදි මෙම අපරාධ ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර, දෙපාර්තමේන්තු නියෝග සී 2 මගින් වාර්තා කළ යුතු අපරාධ ලෙස හඳුන්වා දී ඇත. මෙබඳු අපරාධ කාණ්ඩ 26 ක් ලෙස බෙදා දක්වා ඇති අතර, 2023 වසරේ මෙම අපරාධ වල වාර්තා වීම් සහ විසඳීම් සම්බන්ධ ප්‍රගතිය 2021 හා 2022 වසර හා සංසන්දනාත්මකව පහත වගු සහ ප්‍රස්ථාර මගින් දක්වා ඇත.

බල අපරාධ වගුවෙහි අනු අංක 04, 16, 17, 25 යටතේ එන අපරාධ වල මූල්‍යමය වටිනාකම් වල 2021 වසරෙහි පැවති අගයන් සංශෝධනය වී ඇති අතර, මෙම වගුවෙහි එම සංශෝධිත මූල්‍යමය වටිනාකම් සහ ප්‍රමාණයන් ඇතුළත් කර ඇත. ඒ අනුව 2021 වසරේ රු.25000 ලෙස පැවති මූල්‍යමය අගයන් රු.50000 ලෙසද, රු.300000 ක් ලෙස පැවති මූල්‍යමය අගය රු.500000 ලෙසද සංශෝධනය වී ඇත. තවද පෙර පැවති හෙරොයින් ග්‍රෑම් 2 ක ප්‍රමාණය ග්‍රෑම් 5 දක්වා වැඩි කර ඇති අතර, නිද්‍රාජනක ද්‍රව්‍යයක් වන මෙත්ඇම්පිටමින් (අයිස්) ග්‍රෑම් 10 ක් ලෙස අළුතින් ඇතුළත් කර ඇත.

වගු අංක **03**


## බල අපරාධ


| | ග්‍රහණ අපරාධ | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | අපහරණය | 629 | 536 | 93 | 85% | 582 | 509 | 73 | 87% | 573 | 503 | 70 | 88% |
| 2 | පැහැරගෙන යාම | 172 | 155 | 17 | 90% | 174 | 154 | 20 | 89% | 205 | 181 | 24 | 88% |
| 3 | ගිනි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදුකිරීම | 361 | 287 | 74 | 80% | 509 | 396 | 113 | 78% | 483 | 323 | 160 | 67% |
| 4 | රු50000 ට වැඩි අලාභ ඇති වන පරිදි සිදු කෙරෙන අනර්ථය | 265 | 234 | 31 | 88% | 532 | 433 | 99 | 81% | 321 | 260 | 61 | 81% |
| 5 | ගෙවල් බිඳීම | 6840 | 3759 | 3081 | 55% | 8645 | 4846 | 3799 | 56% | 12138 | 6057 | 6081 | 50% |
| 6 | බරපතල තුවාල සිදුකිරීම | 854 | 812 | 42 | 95% | 923 | 873 | 50 | 95% | 1457 | 1392 | 65 | 96% |
| 7 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදිය) තුවාල කිරීම) | 1843 | 1740 | 103 | 94% | 1888 | 1750 | 138 | 93% | 2275 | 2110 | 165 | 93% |
| 8 | මනුෂ්‍ය ඝාතනය | 521 | 495 | 26 | 95% | 559 | 507 | 52 | 91% | 573 | 526 | 47 | 92% |
| 9 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම / සියපණ හානිකර ගැනීමට අනුබලදීම | 105 | 97 | 8 | 92% | 113 | 101 | 12 | 89% | 165 | 147 | 18 | 89% |
| 10 | ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට වැඩි) | 256 | 245 | 11 | 96% | 257 | 236 | 21 | 92% | 291 | 268 | 23 | 92% |
| 11 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) චින්දිතයාගේ කැමැත්ත ඇතිව | 1377 | 1341 | 36 | 97% | 1391 | 1336 | 55 | 96% | 1259 | 1219 | 40 | 97% |
| | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) චින්දිතයාගේ කැමැත්ත නොමැතිව | 344 | 319 | 25 | 93% | 338 | 322 | 16 | 95% | 375 | 348 | 27 | 93% |
| 12 | නීති විරෝධි රැස්වීම / කැරළි කෝලාහලය | 15 | 13 | 2 | 87% | 210 | 169 | 41 | 80% | 18 | 17 | 1 | 94% |
| 13 | කොල්ලකෑම | 2277 | 1557 | 720 | 68% | 3065 | 1950 | 1115 | 64% | 3150 | 1936 | 1214 | 61% |
| 14 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | 649 | 625 | 24 | 96% | 571 | 543 | 28 | 95% | 675 | 637 | 38 | 94% |
| 15 | බලෙන් ලබා ගැනීම (යම් දේපළක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක්) | 115 | 92 | 23 | 80% | 86 | 74 | 12 | 86% | 145 | 118 | 27 | 81% |
| 16 | රුපියල් 500000/- කට (රුපියල් පන් ලක්ෂයකට) වඩා වටිනාකමකින් යුතු සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම | 2207 | 971 | 1236 | 44% | 2339 | 1165 | 1174 | 50% | 3875 | 1865 | 2010 | 48% |
| 17 | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති වැවිලි ද්‍රව්‍ය සොරකම | 63 | 50 | 13 | 79% | 52 | 45 | 7 | 87% | 78 | 57 | 21 | 73% |
| | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති ගව සොරකම | 365 | 298 | 67 | 82% | 726 | 552 | 174 | 76% | 1682 | 1141 | 541 | 68% |
| | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති දේපළ සොරකම | 4801 | 3167 | 1634 | 66% | 5404 | 3542 | 1862 | 66% | 6968 | 4202 | 2766 | 60% |
| 18 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 40 | 40 | 0 | 100% | 36 | 36 | 0 | 100% | 82 | 75 | 7 | 91% |
| 19 | රාජ්‍ය විරෝධී අන්දමින් සිදු කෙරෙන වැරදි | 1 | 1 | 0 | 100% | 0 | 0 | 0 | 0% | 1 | 1 | 0 | 0% |
| 20 | ළමුන්ට කෲර ලෙස සැළකීම | 87 | 84 | 3 | 97% | 83 | 82 | 1 | 99% | 97 | 89 | 8 | 92% |
| 21 | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 15 | 15 | 0 | 100% | 25 | 25 | 0 | 100% | 24 | 24 | 0 | 100% |
| 22 | කුට්ටනය කිරීම හා කැනැත්තන් වෙළඳාම් කිරීම | 32 | 30 | 2 | 94% | 10 | 10 | 0 | 100% | 10 | 8 | 2 | 80% |
| 23 | පීඩාකාරී ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 100 | 98 | 2 | 98% | 169 | 165 | 4 | 98% | 143 | 134 | 9 | 94% |
| 24 | ස්වයංක්‍රීය ගිනි අවි හෝ රිපීටර් තුවක්කු ලඟතබා ගැනීම | 22 | 21 | 1 | 95% | 27 | 26 | 1 | 96% | 33 | 31 | 2 | 94% |
| 25 | හෙරෝයින්, කොකේන්, මෝෆින් කිසියම් ප්‍රමාණයක් නිශ්පාදනය කිරීම වෙළඳාම් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි, කොකේන් ග්‍රෑම් 02ක් හෝ ඊට වැඩි, මෝෆින් ග්‍රෑම් 03ක් හෝ ඊට වැඩි, ඔපියම් ග්‍රෑම් 500ක් හෝ ඊට වැඩි මෙත්ඇම්පිටමින් නොහොත් අයිස් ග්‍රෑම්ස් 10 ක් හෝ ඊට වැඩි සහ ගංජා කිලෝ ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි හා හෂිස් කිලෝ ග්‍රෑම් 01ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ අන්තරාදායක මත් ද්‍රව්‍ය ලඟ තබා ගැනීම. | 10959 | 10945 | 14 | 100% | 8268 | 8204 | 64 | 99% | 7685 | 7665 | 20 | 100% |
| 26 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම | 97 | 95 | 2 | 98% | 170 | 167 | 3 | 98% | 188 | 181 | 7 | 96% |
| | එකතුව | 35412 | 28122 | 7290 | 79% | 37152 | 28218 | 8934 | 76% | 44969 | 31515 | 13454 | 70% |


මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය


(**සැ.යු.** මෙහි "විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ.)


ඉහත බල අපරාධ වගුව මගින් දක්වා ඇති නිරන්තර අවධානයට පාත්‍ර වන අපරාධ කිහිපයක වාර්තා වීම් සහ විසඳීම් පහත ප්‍රස්ථාර මගින් වැඩිදුරටත් විග්‍රහ කර ඇති අතර, වගුවෙහි සඳහන් කාල සීමාවට අදාළව අපරාධ වාර්තා වීමේ වෙනස්වීම්ද (උච්ඡාවචනයන්) ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත. උදාහරණ ලෙස පහත ගෙවල් බිඳීම් ප්‍රස්ථාරය ගතහොත් 2021 වසරේ වාර්තා වූ ගෙවල් බිඳීම් 6840 ට සාපේක්ෂව 2022 වසරේ 8645 ක් දක්වා 26% කින් ද, ඊට සාපේක්ෂව 2023 වසරේ 12138 ක් දක්වා 40 % කින්ද ඉහළ ගොස් ඇත.












## 2.1.1.(අ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ

පහත වගුව මගින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම් පසුගිය වසර තුනකට අදාළව සන්සන්දනාත්මකව දක්වා ඇත. ඒ යටතේ 2021 සහ 2022 වසර දෙකට සාපේක්ෂව 2023 වසරේ කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තා වීමේ සහ එම අපරාධ විසඳීමේ ස්වභාවය හඳුනාගත හැක.


වගු අංක **04** **කාන්තාවන්ට එරෙහි බල අපරාධ**


| වරද | | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | මිනීමැරීම | 79 | 24 | 55 | 30% | 102 | 98 | 4 | 96% | 105 | 102 | 3 | 97% |
| 2 | සියපණ හානිකර ගැනීමට අනුබල දීම | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 3 | මිනීමැරීමට තැත්කිරීම | 12 | 1 | 11 | 8% | 11 | 11 | 0 | 100% | 16 | 16 | 0 | 100% |
| 4 | ස්ත්‍රී දූෂණය | 187 | 82 | 105 | 44% | 182 | 177 | 5 | 97% | 226 | 224 | 2 | 99% |
| 5 | ව්‍යභිචාරය | 7 | 1 | 6 | 14% | 3 | 3 | 0 | 100% | 3 | 3 | 0 | 100% |
| 6 | බරපතල තුවාල සිදු කිරීම | 121 | 51 | 70 | 42% | 154 | 154 | 0 | 100% | 221 | 221 | 0 | 100% |
| 7 | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම | 73 | 18 | 55 | 25% | 74 | 74 | 0 | 100% | 96 | 96 | 0 | 100% |
| 8 | අස්වාභාවික වැරදි/තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 3 | 2 | 1 | 67% | 1 | 1 | 0 | 100% | 0 | 0 | 0 | 0% |
| 9 | බරපතල ලිංගික අපයෝජනය | 24 | 11 | 13 | 46% | 21 | 21 | 0 | 100% | 37 | 37 | 0 | 100% |
| 10 | අපහරණය | 3 | 1 | 2 | 33% | 1 | 1 | 0 | 100% | 2 | 2 | 0 | 100% |
| 11 | පැහැරගෙනයාම | 49 | 18 | 31 | 37% | 43 | 43 | 0 | 100% | 44 | 44 | 0 | 100% |
| 12 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රීන් සැපයීම | 1 | 0 | 1 | 0% | 1 | 1 | 0 | 100% | 0 | 0 | 0 | 0% |
| 13 | තැනැත්තන් වෙළඳාම (කුට්ටනය) | 3 | 1 | 2 | 33% | 2 | 2 | 0 | 100% | 7 | 7 | 0 | 100% |
| 14 | වෙනත් | 6 | 3 | 3 | 50% | 5 | 5 | 0 | 100% | 2 | 2 | 0 | 100% |
| එකතුව | | 568 | 213 | 355 | 38% | 600 | 591 | 9 | 99% | 759 | 754 | 5 | 99% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


(**සැ.යු.** මෙහි "විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ. 2023 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)


කාන්තාවන්ට එරෙහි බල අපරාධ වල අවදානයට ලක්කළ යුතු අපරාධ කිහිපයක වාර්තාවීම් හා විසඳීම් සම්බන්ධ සන්සන්දනාත්මක විග්‍රහයක් සහ අපරාධ වාර්තාවීමේ වෙනස්කම් (උච්ඡාවචනයන්) පහත ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත



## 2.1.1.(ආ) ළමයින්ට එරෙහි බල අපරාධ

ළමයින්ට එරෙහි බල අපරාධ කාණ්ඩ 15 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. ඒ යටතේ වගුවෙහි සඳහන් වසර තුනට අදාළව එම අපරාධ වාර්තා වීම් සහ විසඳීම් වල ප්‍රගතිය සංසන්දනාත්මකව වගු අංක 05 මගින් විග්‍රහ කර ඇත.


**වගු අංක 05** **ළමයින්ට එරෙහි බල අපරාධ**


| වරද | | | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය |
| 1 | මිනී මැරුම | | 27 | 8 | 19 | 30% | 18 | 18 | 0 | 100% | 16 | 16 | 0 | 100% |
| 2 | සියපණ හානිකරගැනීමට අනුබල දීම | | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 3 | මිනී මැරීමට තැත්කිරීම | | 9 | 3 | 6 | 33% | 13 | 13 | 0 | 100% | 11 | 11 | 0 | 100% |
| 4 | ස්ත්‍රී දූෂණය | වයස අවු 16 ට අඩු කැමැත්ත ඇතිව | 1376 | 610 | 766 | 44% | 1369 | 1366 | 3 | 100% | 1262 | 1254 | 8 | 99% |
| | | වයස අවු 16 ට අඩු කැමැත්ත නොමැතිව | 281 | 122 | 159 | 43% | 324 | 322 | 2 | 99% | 320 | 320 | 0 | 100% |
| | | වයස අවු 16 - 18 අතර | 50 | 24 | 26 | 48% | 54 | 54 | 0 | 100% | 51 | 51 | 0 | 100% |
| 5 | ව්‍යභිචාරය | | 73 | 34 | 39 | 47% | 54 | 54 | 0 | 100% | 63 | 63 | 0 | 100% |
| 6 | බරපතල තුවාල සිදු කිරීම | | 24 | 4 | 20 | 17% | 34 | 34 | 0 | 100% | 57 | 57 | 0 | 100% |
| 7 | පිහි ආදියෙන් තුවාල සිදු කිරීම | | 0 | 0 | 0 | 0% | 7 | 7 | 0 | 0% | 8 | 8 | 0 | 0% |
| 8 | අස්වාභාවික වැරදි/පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | | 6 | 3 | 3 | 50% | 3 | 3 | 0 | 100% | 8 | 8 | 0 | 100% |
| 9 | බරපතල ලිංගික අපයෝජනය | | 580 | 252 | 328 | 43% | 535 | 535 | 0 | 100% | 605 | 605 | 0 | 100% |
| 10 | අපහරණය (කුට්ටනය) | | 611 | 184 | 427 | 30% | 575 | 568 | 7 | 99% | 561 | 555 | 6 | 99% |
| 11 | පැහැරගෙනයාම | | 20 | 5 | 15 | 25% | 30 | 30 | 0 | 100% | 27 | 25 | 2 | 93% |
| 12 | නැනැත්තන් වෙළඳාම (කුට්ටනය) | | 24 | 23 | 1 | 96% | 5 | 5 | 0 | 100% | 3 | 3 | 0 | 100% |
| 13 | ළමයින්ට කෲර ලෙස සැළකීම | | 87 | 33 | 54 | 38% | 83 | 82 | 1 | 99% | 97 | 97 | 0 | 100% |
| 14 | අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | | 15 | 2 | 13 | 13% | 11 | 11 | 0 | 100% | 24 | 24 | 0 | 100% |
| 15 | වෙනත් | | 0 | 0 | 0 | 0% | 1 | 1 | 0 | 100% | 6 | 6 | 0 | 100% |
| එකතුව | | | 3183 | 1307 | 1876 | 41% | 3116 | 3103 | 13 | 100% | 3119 | 3103 | 16 | 99% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


(**සැ.යු.** මෙහි "විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ. 2023 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)

ළමයින්ට එරෙහි බල අපරාධ වල අවදානයට ලක්කළ යුතු අපරාධ කිහිපයක වාර්තාවීම් හා විසඳීම් සම්බන්ධ සන්සන්දනාත්මක විග්‍රහයන් සහ අපරාධ වාර්තාවීමේ වෙනස්කම් (උච්ඡාවචනයන්) පහත ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත.




## 2.1.1(ඇ) ශරීරය පිළිබඳ වැරදි

බල අපරාධ යටතේ ගැනෙන අපරාධ 26 තවදුරටත් විග්‍රහයට බඳුන් කිරීම සඳහා මෙම ශරීරය පිළිබඳ වැරදි ලෙස අපරාධ 13 ක් වෙන් කොට පහත වගුව මගින් දක්වා ඇත. පහත ප්‍රස්ථාරය මගින් මෙම අපරාධ වල සමස්ථ වාර්තා වීම් හා විසඳීම් පසුගිය වසර දෙකකට අදාළව සංසන්දනය කර දක්වා ඇත.

**වගු අංක 06** **ශරීරය පිළිබඳ වැරදි**

| අනු අංකය | ශරීරය පිළිබඳ වැරදි | 2022.01.01 සිට 2022.12.31 | | | 2023.01.01 සිට 2023.12.31 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | අපහරණය | 582 | 509 | 87% | 573 | 503 | 88% |
| 2 | පැහැරගෙන යාම | 174 | 154 | 89% | 205 | 181 | 88% |
| 3 | බරපතල තුවාල සිදු කිරීම | 923 | 873 | 95% | 1457 | 1392 | 96% |
| 4 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදියෙන්) තුවාල කිරීම | 1888 | 1750 | 93% | 2275 | 2110 | 93% |
| 5 | මනුෂ්‍ය ඝාතනය | 559 | 507 | 91% | 573 | 526 | 92% |
| 6 | මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම | 113 | 101 | 89% | 165 | 147 | 89% |
| 7 | ස්ත්‍රී දූෂණය වයස අවු. 16 ට වැඩි | 257 | 236 | 92% | 291 | 268 | 92% |
| 8.1 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය අවු. 16 ට අඩු කැමැත්ත ඇතිව | 1391 | 1336 | 96% | 1259 | 1219 | 97% |
| 8.2 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය වයස අවු. 16 ට අඩු කැමැත්ත නොමැතිව | 338 | 322 | 95% | 375 | 348 | 93% |
| 9 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | 571 | 543 | 95% | 675 | 637 | 94% |
| 10 | ළමුන්ට කෲර ලෙස සැලකීම | 83 | 82 | 99% | 97 | 89 | 92% |
| 11 | ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 25 | 25 | 100% | 24 | 24 | 100% |
| 12 | කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළඳාම | 10 | 10 | 100% | 10 | 8 | 80% |
| 13 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම | 170 | 167 | 98% | 188 | 181 | 96% |
| එකතුව | | 7084 | 6615 | 93% | 8167 | 7633 | 93% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**




ප්‍රස්ථාරයට අනුව ශරීරය පිළිබඳ වැරදි වාර්තාවීම 2022 වර්ෂයේ 7084 සිට 2023 වසරේ 8167 ක් දක්වා 15% කින් ඉහළ ගොස් ඇත.


## 2.1.1(ඈ) දේපළ පිළිබඳ වැරදි

බල අපරාධ වගුවෙහි අංක 14 සිට 22 දක්වා වැරදි දේපළ පිළිබඳ වැරදි ලෙස බෙදා දක්වා ඇති අතර, එම වැරදි වාර්තා වීම් හා විසඳීම් පහත වගුව මගින්ද සමස්ථ වාර්තා වීම් වල ස්වභාවය පසුගිය වසර දෙකකට අදාළව ප්‍රස්ථාරය මගින්ද දක්වා ඇත.

වගු අංක **07** **දේපළ පිළිබඳ වැරදි**

| අනු අංකය | වරද | 2022.01.01 සිට 2022.12.31 | | | 2023.01.01 සිට 2023.12.31 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 14 | බලෙන් ලබා ගැනීම (මුදලක්, යම් දේපලක් හෝ වටිනා ඇපයක්, වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් තැබූ යමක්) | 86 | 74 | 86% | 145 | 118 | 81% |
| 15 | රු.50,000/- කට වඩා වැඩි අලාභ ඇති වන පරිදි සිදු කරන අනර්තය | 532 | 433 | 81% | 321 | 260 | 81% |
| 16 | ගිණි තැබීම හෝ පූපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදු කිරීම | 509 | 396 | 78% | 483 | 323 | 67% |
| 17 | ගෙවල් බිඳ දේපළ සොරකම් කිරීම | 8645 | 4846 | 56% | 12138 | 6057 | 50% |
| 18 | නීති විරෝධී රැස්වීම / කැරළි කෝලාහල | 210 | 169 | 80% | 18 | 17 | 94% |
| 19 | කොල්ලය | 3065 | 1950 | 64% | 3150 | 1936 | 61% |
| 20 | වංචා කිරීම / සාපරාධී සාවද්‍ය පරිහරණය සාපරාධී විශ්වාසය කඩ කිරීම රු.500,000/- ට වැඩි | 2339 | 1165 | 50% | 3875 | 1865 | 48% |
| 21.1 | රු.50,000/- වැඩි වටිනාකම ඇති වැවිලි ද්‍රව්‍ය සොරකම | 52 | 45 | 87% | 78 | 57 | 73% |
| 21.2 | රු.50,000/- වැඩි වටිනාකම ඇති ගව සොරකම | 726 | 552 | 76% | 1682 | 1141 | 68% |
| 21.3 | රු.50,000/- වැඩි වටිනාකම ඇති දේපළ සොරකම | 5404 | 3542 | 66% | 6968 | 4202 | 60% |
| 22 | රාජ්‍ය විරෝධී අන්දමින් සිදු කරන වැරදි | 0 | 0 | 0% | 1 | 1 | 100% |
| එකතුව | | 21568 | 13172 | 61% | 28859 | 15977 | 55% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**




ප්‍රස්ථාරයට අනුව දේපළ පිළිබඳ වැරදි වාර්තාවීම 2022 වර්ෂයේ 21568 සිට 2023 වසරේ 28859 ක් දක්වා 34% කින් ඉහළ ගොස් ඇත.


## 2.1.1(ඉ) ගොදුරු විරහිත වැරදි

මෙම කාණ්ඩය, බල අපරාධ වල අනු අංක 23 සිට 26 දක්වා කොටසට අයත් වන අතර, පහත වගුව සහ ප්‍රස්ථාරය මගින් මෙම ගොදුරු විරහිත වැරදි වල වාර්තා වීමේ සහ විසඳීමේ ස්වභාවය දක්වා ඇත.

**වගු අංක 08** **ගොදුරු විරහිත වැරදි**

| අනු අංකය | වරද | 2022.01.01 සිට 2022.12.31 | | | 2023.01.01 සිට 2023.12.31 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 23 | පීඩාකාරී ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 169 | 165 | 98% | 143 | 134 | 94% |
| 24 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 36 | 36 | 100% | 82 | 75 | 91% |
| 25 | ස්වයංක්‍රීය හෝ රිපීටර් තුවක්කු සන්තකය | 27 | 26 | 96% | 33 | 31 | 94% |
| 26 | හෙරෝයින්, කොකේන්, මෝෆින් කිසියම් ප්‍රමාණයක් නිශ්පාදනය කිරීම වෙළඳාම් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි, කොකේන් ග්‍රෑම් 02ක් හෝ ඊට වැඩි, මෝෆින් ග්‍රෑම් 03ක් හෝ ඊට වැඩි, ඔපියම් ග්‍රෑම් 500ක් හෝ ඊට වැඩි මෙත්ඇම්පිටමින් නොහොත් අයිස් ග්‍රෑම් 10 ක් හෝ ඊට වැඩි සහ ගංජා කිලෝ ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි හා හෂීස් කිලෝ ග්‍රෑම් 01ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ අන්තරාදායක මත් ද්‍රව්‍ය ලහ තබා ගැනීම. | 8268 | 8206 | 99% | 7685 | 7665 | 100% |
| එකතුව | | 8500 | 8433 | 99% | 7943 | 7905 | 100% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**




ප්‍රස්ථාරයට අනුව ගොදුරු විරහිත වැරදි වාර්තාවීම 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේ 8500 සිට 7943 ක් දක්වා 7% කින් පහළ ගොස් ඇත.

## 2.1.2 සුළු අපරාධ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ අතරින් බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙස සඳහන් කර ඇත. ඇතැම් තැනක සුළු වැරදි ලෙසද සඳහන් වන මෙම අපරාධ පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙස කොටස් දෙකකට වර්ග කොට දක්වා ඇත. පහත වගුව මගින් සුළු අපරාධ වාර්තා වීම් සහ විසඳීම් වසර 3කට අදාළව දක්වා ඇත.


## 2.1.2 (අ) පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ


**වගු අංක 09** **පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ**


| වරද | | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | සුළු පහරදීම | 19186 | 11074 | 8112 | 58% | 22164 | 13361 | 8803 | 60% | 21667 | 11959 | 9708 | 55% |
| 2 | නීති විරෝධී ගබ්සා කිරීම | 48 | 30 | 18 | 63% | 65 | 30 | 35 | 46% | 124 | 61 | 63 | 49% |
| 3 | සාපරාධී අයුතු ඇතුළුවීම/ නිවසකට අයුතු ඇතුළුවීම | 1820 | 964 | 856 | 53% | 1740 | 991 | 749 | 57% | 1443 | 654 | 789 | 45% |
| 4 | ලිංගික අපයෝජනය | 3249 | 1731 | 1518 | 53% | 2986 | 1746 | 1240 | 58% | 3177 | 1685 | 1492 | 53% |
| 5 | අයුතු අවහිරය/ අයුතු සිරකරතැබීම | 191 | 131 | 60 | 69% | 217 | 115 | 102 | 53% | 186 | 122 | 64 | 66% |
| 6 | නීති විරෝධී කාර්යයක් සඳහා යම් ගොඩනැගිල්ලක් ආදියක සිට අසුවීම | 15 | 10 | 5 | 67% | 56 | 18 | 38 | 32% | 10 | 4 | 6 | 40% |
| 7 | ප්‍රසිද්ධ සොරකු ගැවසීම | 64 | 18 | 46 | 28% | 19 | 17 | 2 | 89% | 35 | 14 | 21 | 40% |
| 8 | ප්‍රසිද්ධ ස්ථානයක කළහකිරීම | 168 | 124 | 44 | 74% | 281 | 219 | 62 | 78% | 439 | 288 | 151 | 66% |
| 9 | සාපරාධී බලහත්කාරය පෑම, සාපරාධී බියගැන්වීම, ඕනෑකමින් කරනු ලබන නින්දාව | 2095 | 1050 | 1045 | 50% | 2583 | 1649 | 934 | 64% | 2473 | 1236 | 1237 | 50% |
| 10 | පොලිස් නිලධාරියෙකුගේ නීත්‍යානුකූල නියෝගයට අකීකරුවීමක් වශයෙන් පැමිණ නොසිටීම | 221 | 124 | 97 | 56% | 252 | 200 | 52 | 79% | 315 | 170 | 145 | 54% |
| 11 | කවර අන්දමක හෝ තුවාල සිදු කිරීමට තැත්කිරීම | 610 | 460 | 150 | 75% | 727 | 557 | 170 | 77% | 345 | 171 | 174 | 50% |
| 12 | ඇඟ බැඳීමට ඉල්ලුම් කිරීම | 2066 | 1822 | 244 | 88% | 1368 | 1183 | 185 | 86% | 1628 | 1502 | 126 | 92% |
| 13 | අධිකරණයේ බොරු සාක්ෂි දීම හෝ සෑදීම | 691 | 143 | 548 | 21% | 97 | 67 | 30 | 69% | 150 | 57 | 93 | 38% |
| 14 | ල.ද.නි.ස. යටතේ කරන වෙනත් සුළු වැරදි | 44497 | 30910 | 13587 | 69% | 10669 | 6014 | 4655 | 56% | 7652 | 4577 | 3075 | 60% |
| **එකතුව** | | **74921** | **48591** | **26330** | **65%** | **43224** | **26167** | **17057** | **61%** | **39644** | **22500** | **17144** | **57%** |


**(සැ.යු.** මෙහි ‘‘විසඳූ’’ යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස් / නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)


ඉහත වගුවෙහි සඳහන් සුළු අපරාධ වල බහුලව වාර්තා වන සහ අවධානයට ලක් වන අපරාධ පිලිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් වාර්තාවීම්, විසඳීම් සහ උච්ඡාවචනයන්ට අදාළව පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත



## 2.1.2 (ආ) කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ, කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ ලෙස තවදුරටත් බෙදා දක්වනු ලැබේ. එහිදී කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ කාණ්ඩ 15 ක් යටතේ ද, ළමයින්ට එරෙහි සුළු අපරාධ කාණ්ඩ 14 ක් යටතේ ද, පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක **10** **කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ**


| අනු අංකය | වරදේ ස්වභාවය | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය |
| 1 | ලිංගික අතවර කිරීම | 2323 | 2254 | 69 | 97% | 2024 | 1930 | 94 | 95% | 2374 | 2323 | 51 | 98% |
| 2 | ඇතැම් වැරදි වලට අදාල කරුණු පල කිරීම 1995 අංක 22 දරන ල.ද.නි.ස. සංශෝධන පනත 365 | 0 | 0 | 0 | 0% | 1 | 1 | 0 | 100% | 1 | 1 | 0 | 100% |
| 3 | නොසැලකිලිමත් අන්දමින් මරණය සිදු කිරීම | 2 | 2 | 0 | 100% | 2 | 2 | 0 | 100% | 0 | 0 | 0 | 0% |
| 5 | නීත්‍යානුකූලව විවාහ වූ බවට විශ්වාසය වංචනිකව ඇති කරවමින් සංවාසයේ යෙදීම | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 6 | බහු විවාහ සිදු කිරීම | 6 | 6 | 0 | 100% | 12 | 12 | 0 | 100% | 10 | 10 | 0 | 100% |
| 7 | සුළු තුවාල සිදු කිරීම | 3178 | 3172 | 6 | 100% | 3144 | 3134 | 10 | 100% | 4025 | 4021 | 4 | 100% |
| 8 | අයුතු අවහිරය/අයුතු සිරකර තැබීම | 14 | 13 | 1 | 93% | 4 | 4 | 0 | 100% | 3 | 3 | 0 | 100% |
| 9 | අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරකම් පෑම | 23 | 23 | 0 | 100% | 25 | 19 | 6 | 76% | 26 | 26 | 0 | 100% |
| 10 | සාපරාධී බිය ගැන්වීම | 188 | 182 | 6 | 97% | 157 | 155 | 2 | 99% | 208 | 203 | 5 | 98% |
| 11 | ප්‍රකෝප කිරීමේ අරමුණින් ඕනෑකමින් කරනු ලබන නින්දාව | 0 | 0 | 0 | 0% | 1 | 1 | 0 | 100% | 5 | 5 | 0 | 100% |


| අනු අංකය | වරදේ ස්වභාවය | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීම් ප්‍රතිශතය |
| 12 | කලහ කිරීම | 1 | 1 | 0 | 100% | 1 | 1 | 0 | 100% | 4 | 4 | 0 | 100% |
| 13 | ලිංගික අතවර කිරීමට තැත් කිරීම | 45 | 45 | 0 | 100% | 16 | 16 | 0 | 100% | 66 | 66 | 0 | 100% |
| 14 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත යටතේ වැරදි | 534 | 534 | 0 | 100% | 820 | 820 | 0 | 100% | 1553 | 1553 | 0 | 100% |
| 15 | වෙනත් | 158 | 156 | 2 | 99% | 119 | 118 | 1 | 99% | 160 | 158 | 2 | 99% |
| | මුළු එකතුව | **6472** | **6388** | **84** | **99%** | **6326** | **6213** | **113** | **98%** | **8435** | **8373** | **62** | **99%** |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


**(සැ.යු.** මෙහි "විසඳූ" යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස් / නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

ඉහත වගුවෙහි සඳහන් සුළු අපරාධ වලින් බහුලව වාර්තා වන සහ අවධානයට ලක් වන අපරාධ වල සන්සන්දනාත්මක විග්‍රහයක් වාර්තාවීම්,විසඳීම් සහ උච්ඡාවචනයන්ට අදාළව පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.




**වගු අංක 11** **ළමයින්ට එරෙහි සුළු අපරාධ**


| අනු අංකය | වරදේ ස්වභාවය | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා ඛ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඛ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඛ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | ලිංගික අතවර කිරීම | 1341 | 1338 | 3 | 100% | 1252 | 1233 | 19 | 98% | 1497 | 1484 | 13 | 99% |
| 2 | ඇතැම් වැරදි වලට අදාල කරුණු පල කිරීම 1995 අංක 22 දරන ලදනිස සංශෝධන පනත 365 | 1 | 1 | 0 | 100% | 12 | 12 | 0 | 100% | 3 | 3 | 0 | 100% |
| 3 | ළමයින්ට අදාලව කරනු ලබන අසභ්‍ය පළ කිරීම් හා ප්‍රදර්ශනය | 10 | 10 | 0 | 100% | 9 | 8 | 1 | 89% | 9 | 9 | 0 | 100% |
| 4 | වයස අවුරුදු 18 ට අඩු ළමයින් සිගමන් යෙදවීමට සැලැස්වීම | 6 | 6 | 0 | 100% | 9 | 9 | 0 | 100% | 21 | 21 | 0 | 100% |
| 5 | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හා යෙදවීම | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 1 | 1 | 0 | 0% |
| 6 | පහරදි තුවාල සිදු කිරීම | 422 | 422 | 0 | 100% | 566 | 564 | 2 | 100% | 721 | 719 | 2 | 100% |
| 7 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත යටතේ අධිකරණයට ඉදිරිපත් කිරීම | 6 | 6 | 0 | 100% | 3 | 3 | 0 | 100% | 2 | 2 | 0 | 100% |
| 8 | ලිංගික අතවර කිරීමට තැත් කිරීම | 8 | 8 | 0 | 100% | 6 | 6 | 0 | 100% | 13 | 13 | 0 | 100% |
| 9 | ළමුන් මෙහෙකාර සේවයේ යෙදවීම | 2 | 2 | 0 | 100% | 3 | 3 | 0 | 100% | 1 | 1 | 0 | 100% |
| 10 | ළමයින් නීති විරෝධී හදා වඩා ගැනීම් | 0 | 0 | 0 | 0% | 2 | 2 | 0 | 100% | 0 | 0 | 0 | 0% |
| 11 | ළමුන් අධ්‍යාපනය ලබා ගැනීමෙන් වළක්වාලීම | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 12 | ළමුන් සාපරාධී බියගැන්වීම හා බැන තර්ජනය කිරීම | 21 | 20 | 1 | 95% | 20 | 20 | 0 | 100% | 16 | 12 | 4 | 75% |
| 13 | ආරක්ෂාව හා භාරය සඳහා ළමුන් ගැනීම | 279 | 279 | 0 | 100% | 283 | 283 | 0 | 100% | 423 | 423 | 0 | 100% |
| 14 | වෙනත් | 91 | 91 | 0 | 100% | 134 | 131 | 3 | 98% | 100 | 100 | 0 | 100% |
| **එකතුව** | | 2187 | 2183 | 4 | 100% | 2299 | 2274 | 25 | 99% | 2807 | 2788 | 19 | 99% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

**(සැ.යු.** මෙහි "විසඳූ" යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස් / නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

ඉහත වගුවෙහි සඳහන් සුළු අපරාධ වල බහුලව වාර්තා වන සහ අවධානයට ලක් වන අපරාධ පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් වාර්තාවීම්, විසඳීම් සහ උච්ඡාවචනයන්ට අදාළව පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.



## 2.1.2. (ඇ) ළමා හා කාන්තා හිංසනය සහ අපරාධ නිවාරණ වැඩසටහන්

ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි අපරාධ හා හිංසනය අවම කිරීම සඳහා සමාජයේ සෑම පාර්ශවයක්ම දැනුවත් කිරීම අවශ්‍ය වේ. එහිදී ළමයින් සහ වැඩිහිටියන් මෙන්ම අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය සහ එහි ප්‍රාදේශීය අංශ මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 2023 වසරේ පහත පරිදි ක්‍රියාත්මක කර ඇත.

**වගු අංක 12** **නිවාරණ වැඩසටහන්**

| අංශය | ළමුන් දැනුවත් කිරීම | වැඩිහිටියන් දැනුවත් කිරීම | පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | රජයේ නිලධාරීන් දැනුවත් කිරීම | වෙනත් දේශන |
|---|---|---|---|---|---|
| ළමා හා කාන්තා කාර්යාංශය මගින් | 90 | 30 | 33 | 20 | 11 |
| කොට්ඨාස හා පොලිස් ස්ථාන කාර්යාංශ මගින් | 21020 | 14476 | 473 | 2422 | 3863 |
| **එකතුව** | **21110** | **14506** | **506** | **2442** | **3874** |

**මූලාශ්‍රය - ළමා හා කාන්තා කාර්යාංශය**

## 2.1.2 (ඈ) දේපළ වලට එරෙහි සුළු අපරාධ

දේපළ සම්බන්ධ සුළු අපරාධ කාණ්ඩ 11 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. පොලීසිය වෙත වාර්තා වන දේපළ සම්බන්ධ සුළු අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය ගත් විට බල අපරාධ, විවිධ පැමිණිළි ආදී ක්ෂේත්‍ර වල විසඳීමේ ප්‍රතිශතයට සාපේක්ෂව පැහැදිලි වෙනසක් පවතින බව පහත වගුව අනුව පෙනී යයි. වගුව මගින් වසර තුනකට අදාළ දත්ත වාර්තාවීම් සහ විසඳීම් සන්සන්දනාත්මකව දක්වා ඇත.

**වගු අංක 13** **දේපල වලට එරෙහි සුළු අපරාධ**


| | වරද | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ඇති | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | ගෙවල් බිඳීමේ උපකරණ නීති විරෝධී ලෙස තම ස්වාමීත්වයේ තබා ගැනීම | 62 | 23 | 39 | 37% | 157 | 95 | 62 | 61% | 175 | 95 | 80 | 54% |
| 2 | ආගම් වලට / පූජනීය ස්ථාන/ පූජා භාණ්ඩ වලට සිදුකරන හානි පිළිබඳ වැරදි | 37 | 18 | 19 | 49% | 38 | 26 | 12 | 68% | 56 | 24 | 32 | 43% |
| 3 | කිරුම් හා මිණුම් පිළිබඳ වැරදි | 16 | 10 | 6 | 63% | 16 | 14 | 2 | 88% | 24 | 7 | 17 | 29% |
| 4 | විකිණීමට හෝ මහජන ප්‍රදර්ශනය සඳහා අසභ්‍ය පොත් ආදිය ළඟ තබා ගැනීම, අසභ්‍ය සඟරා, ඡායාරූප, පොත්පත් විකිණීම ආදිය | 14 | 6 | 8 | 43% | 26 | 9 | 17 | 35% | 25 | 19 | 6 | 76% |
| 5 | සොරකම් කිරීමට හෝ මංකොල්ල කෑමට තැත් කිරීම | 1088 | 461 | 627 | 42% | 2383 | 1178 | 1205 | 49% | 2113 | 878 | 1235 | 42% |
| 6 | අනර්ඝය රුපියල් 50000 ට අඩු | 2811 | 1273 | 1538 | 45% | 3501 | 1806 | 1695 | 52% | 3031 | 1449 | 1582 | 48% |
| 7 | සොරකම් රුපියල් 50000 ට අඩු | 17814 | 5955 | 11859 | 33% | 38107 | 12786 | 25321 | 34% | 28966 | 9700 | 19266 | 33% |


| වරද | | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර්තු ඇ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | මාර්තු ඇ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | මාර්තු ඇ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| **8** | සාපරාධී විශ්වාසය කඩ කිරීම/ වංචාව/ සාවද්‍ය පරිහරණය රුපියල් **500000** ට අඩු | 5316 | 1815 | 3501 | 34% | 7596 | 3029 | 4567 | 40% | 10778 | 3779 | 6999 | 35% |
| **9** | මහජන පීඩා සම්බන්ධයෙන් පැමිණිලි කිරීම | 225 | 178 | 47 | 79% | 130 | 67 | 63 | 52% | 664 | 200 | 464 | 30% |
| **10** | අංක **44** දරන ප්‍රාථමික අධිකරණ පනතේ වගන්ති **66** යටතේ කරන ලද ඉල්ලීම | 565 | 229 | 336 | 41% | 891 | 630 | 261 | 71% | 451 | 235 | 216 | 52% |
| **11** | වෙනත් | 5872 | 4176 | 1696 | 71% | 4351 | 2294 | 2057 | 53% | 3231 | 1792 | 1439 | 55% |
| එකතුව | | **33820** | **14144** | **19676** | **42%** | **57196** | **21934** | **35262** | **38%** | **49514** | **18178** | **31336** | **37%** |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


**(සැ.යු.** මෙහි "විසඳූ" යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස් / නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)


ඉහත වගුවෙහි සඳහන් සුළු අපරාධ වල බහුලව වාර්තා වන සහ අවධානයට ලක් වන අපරාධ පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් වාර්තාවීම්, විසඳීම් සහ උච්ඡාවචනයන්ට අදාළව පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.



## 2.1.3. මත්ද්‍රව්‍ය අපරාධ

වගුවට අනුව කාණ්ඩ 13 ක් යටතේ වර්ගීකරණය කරන ලද නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අතර, පහත වගුව මගින් 2022, 2023 කාලසීමාවට අයත් මත්ද්‍රව්‍ය අපරාධ පිළිබඳ තොරතුරු දක්වා ඇත.

**වගු අංක 14** **නිද්‍රාජනක ද්‍රව්‍ය**


| අ.අ | නිද්‍රා ජනක වර්ගය | 2022 | | | | | | | 2023 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්තා ඛා | නඩු පවරා ලද | වැරදිකරුවන් ඛු සුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම් /මි.ග්‍රෑම්) | | | වර්තා ඛා | නඩු පවරා ලද | වැරදිකරුවන් ඛා සුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම් /මි.ග්‍රෑම්) | | |
| | | | | | | කි.ග්‍රෑම් | ග්‍රෑම් | මි.ග්‍රෑම් | | | | | කි.ග්‍රෑම් | ග්‍රෑම් | මි.ග්‍රෑම් |
| 1 | ගංජා | 52634 | 50921 | 46325 | 97% | 835 | 119 | 112 | 72685 | 68628 | 53278 | 94% | 5597 | 949 | 852 |
| 2 | අබිං | 6 | 4 | 4 | 67% | 0 | 12 | 150 | 12 | 12 | 8 | 100% | 0 | 2 | 203 |
| 3 | හෂිස් | 483 | 480 | 416 | 99% | 51 | 0 | 16 | 408 | 361 | 313 | 88% | 104 | 111 | 201 |
| 4 | හෙරොයින් | 70599 | 62941 | 54236 | 89% | 1445 | 970 | 68 | 75832 | 68647 | 45580 | 91% | 144 | 813 | 57 |
| 5 | මෝෆින් | 18 | 17 | 10 | 94% | 0 | 2 | 683 | 143 | 128 | 82 | 90% | 0 | 367 | 503 |
| 6 | කොකේන් | 31 | 31 | 29 | 100% | 369 | 898 | 475 | 33 | 30 | 21 | 91% | 1 | 470 | 365 |
| 7 | අයිස් | 20105 | 18955 | 17955 | 94% | 252 | 420 | 568.1 | 32074 | 30267 | 21597 | 94% | 66 | 394 | 77 |
| 8 | බාබුල් | 97 | 97 | 91 | 100% | 2 | 534 | 278 | 60 | 53 | 43 | 88% | 7 | 258 | 319 |
| 9 | මාවා | 508 | 415 | 373 | 82% | 25 | 46 | 897 | 701 | 658 | 508 | 94% | 1185 | 596 | 501 |
| 10 | වෙනත් | 9053 | 8741 | 7612 | 97% | 97 | 694 | 20 | 7937 | 6988 | 5075 | 88% | 210 | 887 | 27 |
| එකතුව | | 153534 | 142602 | 127051 | 93% | | | | 189885 | 175772 | 126505 | 93% | 7318 | 850 | 105 |


| අ.අ | වර්ගය | වර්තා ඛා | නඩු පවරා ලද | වැරදිකරුවන් ඛා සුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | වර්තා ඛා | නඩු පවරා ලද | වැරදිකරුවන් ඛා සුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | මත්පෙති | 27 | 27 | 4 | 100% | 48220 | 11 | 9 | 4 | 82% | 218330 |
| 12 | මත් මුද්දර | 2 | 2 | 2 | 100% | 436 | 0 | 0 | 0 | 0% | 0 |
| 13 | වේදනා නාශක පෙති | 1 | 1 | 1 | 100% | 296 | 0 | 0 | 0 | 0% | 0 |
| **එකතුව** | | **183327** | **170840** | **153089** | **93%** | **48952** | **230688** | **213747** | **153732** | 93% | **218330** |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


**(සැ.යු.** මෙහි "නඩු පවරන ලද සංඛ්‍යාව" යන්නට වරදකරු වීමෙන් අවසන් වූ සංඛ්‍යාව, චූදිත නිදොස් හෝ නිදහස් හෝ අන්‍යාකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව සහ අධිකරණයේ විභාග වන සහ රස පරීක්ෂක වාර්තා නොලැබුණු සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)


ඉහත වගුවට අනුව අංක 11, 12, 13 යටතේ ගැනෙන මත්ද්‍රව්‍ය වල අඩු වීමක් හෝ වාර්තා නොවීමක් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දක්නට ලැබීම යහපත් ප්‍රවණතාවයක් ලෙස දැක්විය හැකි වේ. වගුවෙහි සඳහන් බහුල ලෙස වාර්තා වන නිදර්ශනක ද්‍රව්‍ය පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.












2022 වසරට සාපේක්ෂව 2023 වසරේ ප්‍රස්ථාර මගින් දක්වා ඇති නිදර්ශනක ද්‍රව්‍ය සම්බන්ධ වාර්තා වීම් ඉහළ යාමක් දක්නට ලැබේ. එනම් ගංජා 38% කින්ද, හෙරොයින් 7% කින්ද, කොකේන් 6% කින්ද ඉහළ ගොස් ඇත. අයිස් 60% කින්ද, මාවා 38% කින්ද කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, සමස්ථ මත්ද්‍රව්‍ය අපරාධ 26% කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම ගංජා අත්අඩංගුවට ගැනීම ඉතා විශාල ලෙස (570% කින්) ඉහළ ගොස් ඇත. මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් ගත් විට ගංජා සහ මාවා යන මත්ද්‍රව්‍ය වල අත්අඩංගුවට ගත් කිලෝග්‍රෑම් ප්‍රමාණයේද විශාල ඉහළ යාමක් ප්‍රස්ථාර මගින් හඳුනාගත හැකිය.

## පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සිදුකළ වැටලීම් ඡායාරූප




2023.01.17 වන දින මහර දී හෙරොයින් ග්‍රෑම් 281 මිලිග්‍රෑම් 200 ක් අඩංගුවට ගැනීම.



2023.03.28 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ ගුවන් තොටුපල ඒකකය විසින් Pregabalin වර්ගයේ මත් කරල් 11300 ක් අත් අඩංගුවට ගැනීම.



2023.11.22 වන දින පානදුර දී මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදල් රු 51,112,900/- අත්අඩංගුවට ගැනිම.



2023.02.18 වන දින බද්දේගම දී මෙත්ඇම්පිටමින් ග්‍රෑම් 112 ක් අත් අඩංගුවට ගැනීම.



2023.01.04 වන දින මන්නාරම දී කේරල ගංජා කිලෝග්‍රෑම් 116 යි ග්‍රෑම් 768 ක් අත්අඩංගුවට ගැනීම.



2023.02.15 වන දින මාලඹේ දී හෂිස් කිලෝ 1 යි ග්‍රෑම් 98 ක් හා කොකේන් ග්‍රෑම්1 ක් අත්අඩංගුවට ගැනීම.

## 2.1.4. සුරාබදු වැරදි

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන සුරාබදු වැරදි කාණ්ඩ 12 ක් යටතේ වර්ග කොට පහත වගුව මගින් දක්වා ඇති අතර, බහුල ලෙස වාර්තා වන සහ වගුවේ සඳහන් කාල සීමාව තුළ වාර්තා වීමේ සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරන සුරාබදු වැරදි පිළිබඳ සරල විග්‍රහයක් පහත ප්‍රස්ථාර මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක **15** සුරා බදු වැරදි

| අනු අංකය | වරද | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් සිදුගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් සිදුගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් සිදුගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය |
| 1 | නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 17478 | 13247 | 9100 | 76% | 17499 | 15859 | 11467 | 91% | 21606 | 18950 | 14035 | 88% |
| 2 | බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදනය කිරීම | 126 | 103 | 109 | 82% | 125 | 125 | 115 | 100% | 139 | 115 | 90 | 83% |
| 3 | නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 110 | 98 | 53 | 89% | 113 | 111 | 104 | 98% | 102 | 102 | 93 | 100% |
| 4 | නීති විරෝධී ලෙස ස්ප්‍රිතු වර්ග නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 742 | 685 | 448 | 92% | 507 | 466 | 402 | 92% | 414 | 393 | 337 | 95% |
| 5 | නීති විරෝධී මත්පැන් විකිණීම/ ළඟතබා ගැනීම | 106415 | 84158 | 63931 | 79% | 106286 | 95972 | 74816 | 90% | 183306 | 165095 | 136808 | 90% |
| 6 | නීති විරෝධී මහ රා විකිණීම / ළඟතබා ගැනීම | 2612 | 2175 | 1746 | 83% | 2404 | 2292 | 1856 | 95% | 2559 | 1912 | 1659 | 75% |
| 7 | බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 කට වඩා ළඟතබා ගැනීම | 4272 | 3686 | 2928 | 86% | 3068 | 2958 | 2621 | 96% | 2348 | 2220 | 2029 | 95% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | බලපත්‍රයක් නොමැතිව බීයර් වර්ග හා අනෙකුත් මත්පැන් වර්ග විකිණීම/ විකිණීම සඳහා ළඟතබා ගැනීම | 865 | 762 | 646 | 88% | 913 | 890 | 774 | 97% | 938 | 891 | 754 | 95% |
| 9 | නීති විරෝධී ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රිතු වර්ග ලඟතබා ගැනීම හා විකිණීම | 1974 | 1732 | 1679 | 88% | 566 | 557 | 474 | 98% | 963 | 918 | 779 | 95% |
| 10 | නීති විරෝධී මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා / අනෙකුත් ෂ්‍රීත්තු වර්ග/ රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම | 293 | 244 | 206 | 83% | 106 | 94 | 67 | 89% | 463 | 348 | 273 | 75% |
| 11 | නීති විරෝධී මත්පැන් / ෂ්‍රීත්තු වර්ග / මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ලඟතබා ගැනීම | 744 | 620 | 420 | 83% | 397 | 391 | 297 | 98% | 473 | 457 | 356 | 97% |
| 12 | සුරාබදු ආඥාපනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 2948 | 2417 | 1610 | 82% | 2387 | 2079 | 1520 | 87% | 4866 | 4444 | 3676 | 91% |
| | එකතුව | 138579 | 109927 | 82876 | 79% | 134371 | 121794 | 94513 | 91% | 218177 | 195845 | 160889 | 90% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


**(සැ.යු.** මෙහි "නඩු පවරන ලද සංඛ්‍යාව" යන්නට වරදකරු වීමෙන් අවසන් වූ සංඛ්‍යාව, චූදිත නිදොස් හෝ නිදහස් හෝ අන්‍යාකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව සහ අධිකරණයේ විභාග වන සහ රස පරීක්ෂක වාර්තා නොලැබුණු සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)


මෙම ප්‍රස්ථාර මගින් වගුවෙහි සඳහන් කාල සීමාවට අදාළව වාර්තා කරන ලද සුරාබදු වැරදි කීපයක වාර්තා වීම්, නඩු පැවරීම් සහ වසර තුනට අදාළ වෙනස්වීම් (උච්ඡාවචනයන්) දක්වා ඇත.



## 2.1.5. ව්‍යවස්ථාපිත වැරදි

විවිධ ව්‍යවස්ථාපිත පනත් මගින් තහනම් කරණ ලද වැරදි කාණ්ඩ 31 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇති අතර, වගුවෙහි සඳහන් වසර තුනට අදාළව වාර්තා වීම් සහ විසඳීම් සන්සන්දනාත්මකව ඉදිරිපත් කර ඇත.


**වගු අංක - 16** **ව්‍යවස්ථාපිත පනත් යටතේ සිදු කරනු ලබන වැරදි**


| අ. අ | වරද | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා ගත | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ගත | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා ගත | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | 2009 අංක 20 දරන විදුලිබල පනත - වංචනික ලෙස විදුලිය ලබා ගැනීම | 446 | 365 | 81 | 82% | 293 | 236 | 57 | 81% | 426 | 374 | 52 | 88% |
| 2 | අයාල ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 389 | 377 | 12 | 97% | 315 | 289 | 26 | 92% | 256 | 250 | 6 | 98% |
| 3 | සත්ත්ව විධිනිංසා පනත යටතේ කරනු ලබන වැරදි | 538 | 497 | 41 | 92% | 483 | 443 | 40 | 92% | 554 | 514 | 40 | 93% |
| 4 | බලපත්‍ර නොමැතිව ඉන්ධන ලබාගැනීම හෝ විකිණීම | 35 | 29 | 6 | 83% | 1166 | 1102 | 64 | 95% | 115 | 113 | 2 | 98% |
| 5 | පුරාවස්තු සොරකම් කිරීම් හෝ විනාශ කිරීම හෝ ළඟ තබා ගැනීම | 228 | 192 | 36 | 84% | 212 | 183 | 29 | 86% | 237 | 191 | 46 | 81% |
| 6 | සුදු ආඥාපනත යටතේ කරන ලද වැරදි | 1283 | 1115 | 168 | 87% | 1244 | 1185 | 59 | 95% | 1431 | 1358 | 73 | 95% |
| 7 | රේඟු ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 103 | 87 | 16 | 84% | 19 | 18 | 1 | 95% | 51 | 48 | 3 | 94% |
| 8 | තේ හා රබර් ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 64 | 60 | 4 | 94% | 27 | 21 | 6 | 78% | 15 | 13 | 2 | 87% |
| 9 | 1981 අංක 87 හා 1988 අංක 64 දරණ පනතින් සංශෝධනය වූ වෙරළ සංරක්ෂණ පනත යටතේ කරන ලද වැරදි | 90 | 82 | 8 | 91% | 95 | 93 | 2 | 98% | 101 | 101 | 0 | 100% |
| 10 | ව්‍යාජ ලෙස සී.ඩී/ ඒ.සී.ඩී/ ඩී.වී.ඩී කැටි නීති විරෝධී ලෙස සකස් කිරීම | 40 | 31 | 9 | 78% | 22 | 20 | 2 | 91% | 37 | 36 | 1 | 97% |
| 11 | පාරිසරික පනත් යටතේ කරන ලද වැරදි | 1583 | 1418 | 165 | 90% | 1606 | 1465 | 141 | 91% | 1757 | 1612 | 145 | 92% |
| 12 | තහනම් පිතිය ළඟකබා ගැනීම | 180 | 154 | 26 | 86% | 205 | 195 | 10 | 95% | 301 | 274 | 27 | 91% |
| 13 | බලපත්‍රයක් නොමැතිව ගිනිකෙළි භාණ්ඩ ළඟකබා ගැනීම් හා ප්‍රදර්ශණය කිරීම | 15 | 14 | 1 | 93% | 8 | 8 | 0 | 100% | 34 | 32 | 2 | 94% |
| 14 | බලපත්‍රයක් නොමැතිව සුසුරණ ද්‍රව්‍ය ළඟකබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 206 | 165 | 41 | 80% | 110 | 93 | 17 | 85% | 141 | 122 | 19 | 87% |
| 15 | බලපත්‍රයක් නොමැතිව පතොරම් ළඟකබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 64 | 49 | 15 | 77% | 34 | 27 | 7 | 79% | 81 | 71 | 10 | 88% |
| 16 | බිම්ත්ව කරන ලද වැරදි - 1979 අංක 41 දරන පනත | 4315 | 3950 | 365 | 92% | 5698 | 5385 | 313 | 95% | 6172 | 5844 | 328 | 95% |
| 17 | බලපත්‍රයක් නොමැතිව තුවක්කු නිෂ්පාදනය කිරීම/ ළඟ තබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 1934 | 1633 | 301 | 84% | 1685 | 1526 | 159 | 91% | 2217 | 1994 | 223 | 90% |
| 18 | ධීවර ආඥාපනත යටතේ කරන ලද වැරදි | 152 | 140 | 12 | 92% | 185 | 174 | 11 | 94% | 209 | 187 | 22 | 89% |
| 19 | ඩයිනමයිට්/ සුසුරණ ද්‍රව්‍ය දමා මසුන් ඇල්ලීම | 12 | 8 | 4 | 67% | 10 | 10 | 0 | 100% | 25 | 25 | 0 | 100% |
| 20 | ලයිවිකෝස් ක්‍රමය භාවිතාකර මසුන් ඇල්ලීම | 7 | 3 | 4 | 43% | 0 | 0 | 0 | 0% | 2 | 2 | 0 | 0% |
| 21 | 1970 අංක 01 දරන සංශෝධිත වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ පනත යටතේ වැරදි | 486 | 395 | 91 | 81% | 540 | 497 | 43 | 92% | 792 | 706 | 86 | 89% |
| 22 | ආරක්ෂිත සතුන් දඩයම් කිරීම | 88 | 81 | 7 | 92% | 72 | 65 | 7 | 90% | 136 | 127 | 9 | 93% |
| 23 | බලපත්‍රයක් නොමැතිව සත්ත්ව කොටස් ළඟකබා ගැනීම | 156 | 139 | 17 | 89% | 133 | 119 | 14 | 89% | 220 | 212 | 8 | 96% |
| 24 | දඩමස් ළඟකබා ගැනීම | 575 | 512 | 63 | 89% | 595 | 528 | 67 | 89% | 768 | 704 | 64 | 92% |
| 25 | 1966 අංක 13 දරන වන ආඥාපනත යටතේ කරන ලද වැරදි | 353 | 289 | 64 | 82% | 208 | 165 | 43 | 79% | 138 | 114 | 24 | 83% |
| 26 | රක්ෂිත වනය විනාශ කිරීම, හානි කිරීම හෝ ගස් කැපීම | 519 | 350 | 169 | 67% | 291 | 222 | 69 | 76% | 358 | 288 | 70 | 80% |
| 27 | නීති විරෝධී ලෙස වැලි/ පස් ගොඩදැමීම හෝ ප්‍රවාහනය | 8826 | 8310 | 516 | 94% | 4718 | 4461 | 257 | 95% | 4424 | 4219 | 205 | 95% |
| 28 | නීති විරෝධී ලෙස දැව ප්‍රවාහනය කිරීම | 868 | 622 | 246 | 72% | 691 | 570 | 121 | 82% | 543 | 479 | 64 | 88% |
| 29 | මැණික් හා ස් වර්ණාභරණ ආඥාපනත යටතේ කරන ලද වැරදි | 195 | 155 | 40 | 79% | 239 | 175 | 64 | 73% | 769 | 628 | 141 | 82% |
| 30 | නීති විරෝධී මැණික් ගැරීම | 571 | 519 | 52 | 91% | 1122 | 1027 | 95 | 92% | 1525 | 1367 | 158 | 90% |
| 31 | වෙනත් | 4761 | 3281 | 1480 | 69% | 1717 | 1546 | 171 | 90% | 2171 | 2041 | 130 | 94% |
| එකතුව | | 29082 | 25022 | 4060 | 86% | 23743 | 21848 | 1895 | 92% | 26006 | 24046 | 1960 | 92% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


**(සැ.යු.** මෙහි "විසඳූ" යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස් / නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)


ඉහත වගුවෙහි සඳහන් ව්‍යවස්ථාපිත වැරදි අතරින් බහුල ලෙස වාර්තා වන වැරදි කීපයක වාර්තා වීම්, විසඳීම් සහ වසර තුනට අදාළ වෙනස්වීම් (උච්ඡාවචනයන්) පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.




## 2.1.6. දුරාචාරය සම්බන්ධ දූෂණ වැරදි


කාණ්ඩ 6 ක් යටතේ ඉදිරිපත් කර ඇති මෙම දූෂණ වැරදි පසු ගිය වසර තුනකට අදාළව පහත වගුව මගින් දක්වා ඇති අතර, තෝරාගත් වැරදි කිහිපයක් සම්බන්ධ වාර්තා වීම්, නඩු පැවරීම් සහ වසර තුනෙහි සන්සන්දනාත්මක වෙනස් වීම් (උච්ඡාවචනයන්) ප්‍රස්ථාර මගින් වැඩිදුරටත් ඉදිරිපත් කර ඇත.


වගු අංක **17** දුරාචාරය සම්බන්ධ දූෂණ වැරදි


| අනු අංකය | වරද | 2021 | | | | | 2022 | | | | | 2023 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම් ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | |
| | | | | | පුරුෂ | ස්ත්‍රී | | | | පුරුෂ | ස්ත්‍රී | | | | පුරුෂ | ස්ත්‍රී |
| 1 | වෛශ්‍යා වෘත්තිය | 203 | 185 | 91% | 17 | 206 | 145 | 145 | 100% | 13 | 336 | 207 | 206 | 100% | 24 | 201 |
| 2 | ගණිකා නිවාස | 199 | 182 | 91% | 136 | 360 | 355 | 325 | 92% | 195 | 730 | 843 | 825 | 98% | 538 | 2000 |
| 3 | පෙළඹවීම් (වයස 18 ට අඩු ළමයෙක් ලිංගික අපයෝජනය සඳහා) | 7 | 7 | 100% | 0 | 7 | 116 | 101 | 87% | 27 | 182 | 110 | 107 | 97% | 14 | 155 |
| 4 | සමලිංගික සම්බන්ධතා | 12 | 11 | 92% | 11 | 0 | 0 | 0 | 0% | 0 | 0 | 3 | 0 | 0% | 0 | 0 |
| 5 | සෙළුව පෙන්වීම, කාමුක ලෙස එබිබැලීම සහ හිරිඔතප් බිඳීම | 37 | 37 | 100% | 29 | 5 | 28 | 18 | 64% | 16 | 0 | 21 | 9 | 43% | 16 | 0 |
| 6 | අසභ්‍ය කාඩ්පත්, ඡායාරූප හා පත්‍රිකා විකිණීම | 29 | 29 | 100% | 28 | 6 | 27 | 27 | 100% | 20 | 6 | 19 | 19 | 100% | 16 | 2 |
| එකතුව | | 487 | 451 | 93% | 221 | 584 | 671 | 616 | 92% | 271 | 1254 | 1203 | 1166 | 97% | 608 | 2358 |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

(**සැ.යු.** මෙහි නඩු පැවරූ සංඛ්‍යාව යනු පොලීසිය විසින් විමර්ශන අවසන් කර අධිකරණයේ නඩු පැවරූ සංඛ්‍යාව වේ.)



## 2.1.7. අපරාධ විමර්ශනය සහ නිවාරණ කාර්යයෙහිලා ඇඟිලි සටහන් සහ නව තාක්ෂණික ක්‍රමවේදයන්හි දායකත්වය

අපරාධ විමර්ශනය සඳහා පහත සඳහන් දත්ත පද්ධති මඟින් සිදු කරනු ලබන විශ්ලේෂණ කාර්යයන් ඔස්සේ ප්‍රභල දායකත්වයක් සපයා ඇත.

i. ස්වයංක්‍රීය ඇඟිලි සටහන් මඟින් හඳුනාගැනීමේ දත්ත පද්ධතිය

ii. මුහුණු මඟින් සැකකරුවන් හඳුනාගැනීමේ දත්ත පද්ධතිය

iii. අත්අඩංගුවට ගත් සැකකරුවන් නියාමනය කිරීමේ දත්ත පද්ධතිය

iv. අපරාධ බුද්ධි තොරතුරු විශ්ලේෂණ දත්ත පද්ධතිය

මෙම දත්ත පද්ධති උපයෝගී කර ගැනීම තුළින් පහත දැක්වෙන පරිදි අපරාධ විමර්ශනය සඳහා දායකත්වය ලබා දී ඇත.

- 2023 වසරේ සෝදිසි කිරීම සඳහා ඇඟිලි සටහන්පත් 209113 ක් ලැබී තිබූ අතර ඉන් ඌනතා රහිත 182631 ක් සෝදිසිකොට 35332 ක් අපරාධ වැරදි සහිත ලෙස හඳුනාගෙන ඇත.
- 2023 වසරේ අපරාධ ස්ථාන 12219 ක් පරීක්ෂා කර ඇති අතර ඉන් අපරාධ ස්ථාන 5512 කින් සටහන් සොයාගෙන ඇත .
- අපරාධ ස්ථාන පරීක්ෂාකර ලබා ගත් ඇඟිලි සටහන් මඟින් හඳුනාගත් අපරාධකරුවන් සංඛ්‍යාව 150 කි.
- අපරාධකරුවන්ගේ තොරතුරු ලේඛනගත කර පොලිස් සථාන වෙත ලබා දීම මඟින් ඔවුන් පරිපාලනය කිරීම සහ අපරාධ විමර්ශන කාර්යය සඳහා සහාය වීම සිදු කර ඇත. එහිදී 2023 වසරේ ප්‍රථම වරට අපරාධ වරදක් සඳහා පුද්ගලයින් 23475 ක් සහ නැවත වරදකරුවන් වීමෙන් දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් ලෙස පුද්ගලයින් 2656 ක් ලේඛනගත කර ඇත.
- අත්අඩංගුවට ගත් සැකකරුවන් නියාමනය කිරීමේ දත්ත පද්ධතිය (AMIS) මඟින් පහත සඳහන් පරිදි සැකකරුවන් හඳුනාගෙන ඇත.

**වගු අංක 18**

**සැකකරුවන් හඳුනාගැනීම්**

| පලා ගිය සේවා භටයින් | | | පැනගිය සිරකරුවන් | අවශ්‍ය කරන සැකකරුවන් | දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් | එල්.ටී.ටී.ඊ සැකකරුවන් | විවෘත වරෙන්තු සහිත පුද්ගලයින් | ඇඟිලි සටහන් මඟින් හඳුනාගත් සැකකරුවන් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| යුධ | ගුවන් | නාවික | | | | | | | |
| 308 | 114 | 242 | 14 | 23 | 1130 | 245 | 1513 | 76 | 3665 |

**මූලාශ්‍රය - අපරාධ වාර්තා කොට්ඨාසය**

- මත් ද්‍රව්‍ය අපරාධ සම්බන්ධ වැටලීම් සිදු කිරීමේ දී GPS තාක්ෂණය යොදා ගැනීම තුළින් ඉතා නිවැරදිව හා සාර්ථකව මෙම කාර්යයන් ඉටු කිරීමට හැකි වී ඇත.
- අපරාධ විමර්ශනයෙහිලා සිදු කරනු ලබන ආරක්ෂක දුරකථන දත්ත විශ්ලේෂණය සඳහා පරිගණක මෘදුකාංග භාවිතා කිරීම තුළින් එම කාර්යයන්හි ඵලදායීත්වය ඉහළ නංවා ඇත.
- අපරාධ වැලැක්වීම සඳහා සිදු කරනු ලබන ආවේක්ෂණ රාජකාරී සඳහා සී.සී.ටී.වී කැමරා පද්ධතිය යොදා ගනු ලබන අතර එමඟින් ඉතා පුළුල් තාක්ෂණික සහායක් අත් කරගෙන ඇත.
- දියුණු ක්‍රමවේද ඔස්සේ පුහුණු කරන ලද නිල සුනඛයින්ගේ සේවය පහත පරිදි අපරාධ විමර්ශනය සඳහා යොදාගෙන ඇත.

**වගු අංක 19** **නිල සුනඛ වැටලීම්**

| අනු අංකය | රාජකාරී ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පුපුරන ද්‍රව්‍ය පරීක්ෂණ රාජකාරී | 7830 |
| 2 | මත්ද්‍රව්‍ය පරීක්ෂණ රාජකාරී | 3409 |
| 3 | අපරාධ පරීක්ෂණ රාජකාරී | 3175 |

**මූලාශ්‍රය - නිල සුනඛ කොට්ඨාසය**

## 2.2 පොලිස් විශේෂ කාර්ය බලකා වැටලීම්

ශ්‍රී ලංකා පොලිසිය මඟින් සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය, සුරාබදු, අවි ආයුධ, පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම් සහ වෙනත් සියළුම වැටලීම් සඳහා විශේෂ කාර්ය බලකායේ දායකත්වයද හිමිවේ. ඒ යටතේ ඉහත දක්වන ලද ක්ෂේත්‍රයන්ට අදාළව 2023 වසරේ විශේෂ කාර්ය බලකාය මඟින් සිදු කරන ලද සමස්ථ වැටලීම් පහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 20** **විශේෂ කාර්ය බලකා වැටලීම්**

| අනු අංකය | වැටලීම් ක්ෂේත්‍රය | වැටලීම් ගණන | සැකකරුවන් ගණන |
|---|---|---|---|
| 1 | අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය | 461 | 373 |
| 2 | මත්ද්‍රව්‍ය වැටලීම් | 2916 | 2826 |
| 3 | සුරාබදු වැටලීම් | 816 | 825 |
| 4 | පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම් | 1418 | 2089 |
| 5 | වෙනත් වැටලීම් | 529 | 791 |
| එකතුව | | **6140** | **6904** |

**මූලාශ්‍රය - පොලිස් විශේෂ කාර්ය බළකාය**

## ♦ පොලිස් විශේෂ කාර්ය බලකාය සිදුකළ වැටලීම් සම්බන්ධ ඡායාරූප




2023.11.06 වන දින මීගමුව පොලිස් වසමේදී ගිනි අවි, ජීව උණ්ඩ සහ අවි නිෂ්පාදනය සඳහා යොදාගන්නා කොටස් අත්අඩංගුවට ගැනීම.



2023.12.06 වන දින වැල්ලම්පිටිය පොලිස් වසමේදී අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 50 ක්, විද්‍යුත් තරාදි, මුදල් සහ ජංගම දුරකථනයක් අත්අඩංගුවට ගැනීම.



2023.12.17 වන දින ජා ඇළ පොලිස් වසමේදී කේරළ ගංජා කිලෝ 94, ග්‍රෑම් 540 ක් අත්අඩංගුවට ගැනීම.



2023.05.19 වන දින ජාඇල පොලිස් වසමේදී නීති විරෝධී මත්පැන් සහ මත්පැන් පෙරීමට යොදා ගන්නා උපකරණ අත්අඩංගුවට ගැනීම.




2023.01.17 වන දින නිලාවේලි පොලිස් වසමේදී නීති විරෝධී බොරළු මිශ්‍ර පස් හා එම වාහන අත්අඩංගුවට ගැනීම.



2023.11.30 වන දින මහකුඹුක්කඩවල පොලිස් වසමේදී බෝර 12 ගිනි අවි හා එම පතුරම්, මුව මස් හා සතුන්ගේ කොටස් අත්අඩංගුවට ගැනීම.

## 2.3 විවිධ පැමිණිලි


විවිධ පුද්ගල හා සමාජ ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ආරවුල් හෝ ගැටළු සම්බන්ධව සිදුකරන ලබන පැමිණිලි මෙම විවිධ පැමිණිලි ලෙස හඳුන්වා දිය හැක. පොලිසිය වෙත වාර්තා වන මෙබඳු ඛණ්ඩ 16 ක් ලෙස වර්ග කර වාර්තා වීම්, විසඳීම් සම්බන්ධ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත.


**වගු අංක - 21** **විවිධ පැමිණිලි**


| අ.අ. | වාර්තා කරන ලද පැමිණිල්ලේ ස්වභාවය | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | පහරදීම | 183709 | 165193 | 18516 | 90% | 196751 | 181087 | 15664 | 92% | 190873 | 173870 | 17003 | 91% |
| 2 | බැන තර්ජනය කිරීම | 180632 | 164311 | 16321 | 91% | 179651 | 166811 | 12840 | 93% | 182269 | 167385 | 14884 | 92% |
| 3 | පවුල් ආරවුල් | 105469 | 95511 | 9958 | 91% | 111709 | 103553 | 8156 | 93% | 113188 | 104706 | 8482 | 93% |
| 4 | පුරුෂයාගෙන් / භාර්යාවගෙන් ඉවත්වීම හෝ නොසැලකීම, ගෘහස්ථ ප්‍රශ්න | 20500 | 18443 | 2057 | 90% | 22358 | 20442 | 1916 | 91% | 22584 | 20584 | 2000 | 91% |
| 5 | අනියම් සබඳතා නිසා ඇති වන ආරවුල් | 9250 | 8159 | 1091 | 88% | 9636 | 8751 | 885 | 91% | 10408 | 9359 | 1049 | 90% |
| 6 | ඉඩම් ආරවුල් | 106307 | 96960 | 9347 | 91% | 92294 | 84369 | 7925 | 91% | 88526 | 80866 | 7660 | 91% |
| 7 | සාමය කඩවීමේ ගැටළු | 1679 | 1454 | 225 | 87% | 2316 | 2101 | 215 | 91% | 2507 | 2176 | 331 | 87% |
| 8 | විශ්වාසය/ පොරොන්දු කඩකිරීම | 8000 | 6282 | 1718 | 79% | 10964 | 8907 | 2057 | 81% | 12809 | 10660 | 2149 | 83% |
| 9 | මුදල් හා භාණ්ඩ පිළිබඳ | 74359 | 63023 | 11336 | 85% | 88691 | 78050 | 10641 | 88% | 112375 | 97863 | 14512 | 87% |
| 10 | දෙමාපියන්ට නොසැලකීම/ නිරිහැරවීම | 8007 | 7130 | 877 | 89% | 9648 | 8821 | 827 | 91% | 10877 | 9742 | 1135 | 90% |
| 11 | කුලී නිවැසියන් හා අයිතිකරු අතර ආරවුල් | 7321 | 6024 | 1297 | 82% | 6639 | 5680 | 959 | 86% | 7387 | 6328 | 1059 | 86% |
| 12 | සේවකයා හා ස්වාමියා අතර ඇති ආරවුල් | 2630 | 2205 | 425 | 84% | 2453 | 2141 | 312 | 87% | 2863 | 2418 | 445 | 84% |
| 13 | අලාභහානි සිදුවීම පිළිබඳව ගැටළු | 17030 | 14887 | 2143 | 87% | 18157 | 16375 | 1782 | 90% | 19317 | 17287 | 2030 | 89% |
| 14 | මානසික පීඩාවන් ඇතිකිරීම සම්බන්ධ ගැටළු | 7453 | 6779 | 674 | 91% | 10070 | 9513 | 557 | 94% | 9502 | 8649 | 853 | 91% |
| 15 | අකුරුදහන් වීම් පිළිබඳ | 2443 | 1785 | 658 | 73% | 2345 | 1840 | 505 | 78% | 2249 | 1908 | 341 | 85% |
| 16 | වෙනත් පැමිණිලි | 191097 | 171290 | 19807 | 90% | 168432 | 154987 | 13445 | 92% | 145212 | 132684 | 12528 | 91% |
| එකතුව | | 925886 | 829436 | 96450 | 90% | 932114 | 853428 | 78686 | 92% | 932946 | 846485 | 86461 | 91% |


**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**


වගුවෙහි ඇතුළත් විවිධ පැමිණිලි අතුරින් පැමිණිලි කිහිපයක් සම්බන්ධ වාර්තා වීම්, විසඳීම් සහ වාර්තාවීමේ වෙනස්කම් (උච්ඡාවචනයන්) වසර තුනකට අදාළව සන්සන්දනය කර ප්‍රස්ථාර මගින් දක්වා ඇත







## 2.4 රිය අනතුරු

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන රිය අනතුරු, මාරක අනතුරු, බරපතල තුවාල අනතුරු, සුළු තුවාල අනතුරු, දේපළ අලාභ අනතුරුලෙස කාණ්ඩ 04 කට බෙදා දක්ත ඉදිරිපත් කරනු ලැබේ. පහත වගුව මගින් 2021, 2022 සහ 2023 වසර වල දක්ත පදනම් කරගෙන රිය අනතුරු පිළිබඳ සන්සන්දනාත්මක විශ්ලෙෂණයක් ඉදිරිපත් කර ඇත.

වගු අංක 22 රිය අනතුරු

| වර්ෂය | මාරක අනතුරු සංඛ්‍යාව | බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව | සුළු තුවාල අනතුරු සංඛ්‍යාව | දේපළ අලාභ අනතුරු සංඛ්‍යාව | මුළු අනතුරු සංඛ්‍යාව | මිය ගිය සංඛ්‍යාව | වාහන සංඛ්‍යාව | වාහන 1000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 2021 | 2414 | 6401 | 8070 | 5434 | 22319 | 2513 | 8331702 | 3 |
| 2022 | 2395 | 6231 | 8209 | 5118 | 21953 | 2515 | 8021953 | 3 |
| 2023 | 2200 | 6195 | 9725 | 6514 | 24634 | 2310 | 8380103 | 3 |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය

## 2.4.1. අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු

වගු අංක 23 **අධිවේගී මාර්ග රිය අනතුරු**

| අනු අංකය | අනතුරු වර්ගය | | | |
|---|---|---|---|---|
| | | 2021 | 2022 | 2023 |
| 1 | මාරක අනතුරු | 7 | 14 | 4 |
| 2 | බරපතල තුවාල අනතුරු | 9 | 7 | 7 |
| 3 | සුළු තුවාල අනතුරු | 95 | 81 | 82 |
| 4 | දේපළ අලාභ අනතුරු | 350 | 428 | 497 |
| **එකතුව** | | **461** | **530** | **590** |

**මූලාශ්‍රය - අධිවේගී මාර්ග ආරක්ෂක කොට්ඨාසය**

## 2.4.2 රිය අනතුරු වැළැක්වීමේ ක්‍රියාමාර්ග

රිය අනතුරු වැළැක්වීම සඳහා නිලධරයන් මාර්ග ආශ්‍රිතව රාජකාරිවල නියුක්ත කිරීමට අමතරව දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ද ශ්‍රී ලංකා පොලීසිය විසින් අනුගමනය කරනු ලබයි. එහිදී මාර්ගය භාවිතා කරන සමාජයේ විවිධ පාර්ශවයන් දැනුවත් කිරීම ඉතා වැදගත් පියවරක් ලෙස සැලකේ. ඒ සඳහා දැනුවත් කිරීමේ දේශන, වැඩසටහන් සහ ප්‍රදර්ශන කුටි භාවිතා කරනු ලබයි. පහත වගුව මගින් මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගු අංක 24 **වර්ෂය තුළ සිදු කළ අධ්‍යාපන වැඩසටහන්**

| අනු අංකය | අධ්‍යාපන වැඩසටහන් | වැඩසටහන් ගණන | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම් | 26 | 1464 |
| 2 | රාජ්‍ය ආයතන නිලධාරීන් දැනුවත් කිරීම | 8 | 474 |
| 3 | රාජ්‍ය ආයතන දේශන | 6 | 908 |
| 4 | පුද්ගලික ආයතන දේශන | 11 | 710 |
| 5 | පුද්ගලික ආයතන රියදුරු දේශන | 10 | 311 |
| 6 | බස්රථ රියදුරන් දැනුවත් කිරීම | 21 | 2327 |
| 7 | ත්‍රීරෝද රථ රියදුරන් දැනුවත් කිරීම | 2 | 300 |
| 8 | වෙනත් රියදුරන් දැනුවත් කිරීම | 4 | 540 |
| 9 | රථවාහන සංදර්ශන | 30 | 37600 |
| 10 | මූලස්ථාන පාඨමාලා | 9 | 1154 |
| 11 | කණිෂ්ඨ රථවාහන කලමනාකරණ පාඨමාලා | 4 | 382 |
| 12 | ගුවන් හමුදා නිලධාරීන් දැනුවත් කිරීම | 1 | 22 |
| 13 | නාවික හමුදා නිලධාරීන් දැනුවත් කිරීම | 3 | 88 |
| 14 | යුධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීම | 1 | 66 |
| 15 | මාධ්‍ය වැඩසටහන් | 6 | - |
| 16 | ප්‍රදර්ශන කුටි | 3 | 29500 |
| 17 | පාසල් දේශන | 44 | 26870 |
| 18 | රිය නියාමක දේශන | 164 | 2213 |
| **එකතුව** | | **353** | **104929** |

**මූලාශ්‍රය - රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂක කොට්ඨාසය**

## 2.4.3. රථවාහන වැරදි සඳහා දඩපත් මගින් හා අධිකරණයෙන් උපයා දෙනලද ආදායම

වගු අංක 25 දඩපත් ආදායම්

| වරද | | අනාවරණය කළ නඩු සංඛ්‍යාව | දඩපත් නිකුත් කළ සඛ්‍යාව | දඩපත් වලින් ලැබූ ආදායම (රුපියල්) | අධිකරණය මගින් ලැබූ ආදායම (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1 | අනතුරුදායක හා අපරීක්ෂාකාරී ලෙස රිය පැදවීම | 13120 | 0 | | 125,149,550.00 |
| 2 | අධික වේගයෙන් රිය පැදවීම | 18637 | 12430 | 43,341,800.00 | 113,963,150.00 |
| 3 | බීමත්ව රිය පැදවීම | 115409 | 0 | | 2,629,029,711.00 |
| 4 | පහන් නැති මෝටර් වාහන | 138033 | 60318 | 57,629,100.00 | 9,433,624.00 |
| 5 | මාර්ග නීති උල්ලංඝනය කිරීම | 154292 | 143150 | 256,712,200.00 | 7,037,000.00 |
| 6 | ප්‍රවීණතා සහතික නොමැතිව රිය ධාවනය | 39546 | 20022 | 16,903,198.00 | 279,654,425.00 |
| 7 | කළුදුම් සහිත ධාවනය | 909 | 360 | 357,600.00 | 22,560.00 |
| 8 | ආරක්ෂක හිස් වැසුම් නොමැතිව පැදවීම | 273744 | 261325 | 254,081,500.00 | 10,972,605.00 |
| 9 | රතු එළියට විරුද්ධව ධාවනය | 83262 | 78234 | 72,822,000.00 | 1,686,000.00 |
| 10 | පදික මාරුවේ නොනැවැත්වීම | 35125 | 33026 | 32,544,000.00 | 1,136,000.00 |
| 11 | රක්ෂණ සහතික නොමැතිව පැදවීම | 84418 | 230 | 371,500.00 | 111,057,800.00 |
| 12 | හඳුනාගැනීමේ තහඩු පිළිබඳ වැරදි | 21166 | 16033 | 15,835,800.00 | 2,298,510.00 |
| 13 | ආදායම් බලපත්‍ර නොමැතිව පැදවීම | 114659 | 95987 | 93,377,050.00 | 27,223,250.00 |
| 14 | මෝටර් වාහන නැවැත්වීමේ වැරදි | 134133 | 124381 | 123,966,400.00 | 3,738,500.00 |
| 15 | මාර්ගයේ පාවිච්චියට නුසුදුසු වාහන | 1271 | 0 | | 1,144,000.00 |
| 16 | පොලිස් සංඥා සහ විධාන නොපිළිපැදීම | 13231 | 11729 | 20,657,700.00 | 4,698,800.00 |
| 17 | අන්තරාදායක ලෙස භාණ්ඩ පැටවීම හා ප්‍රවාහනය | 3836 | 0 | | 954,000.00 |
| 18 | වංචා සහගත ලෙස අංක තහඩු ආදායම් බලපත්‍ර හා වෙනත් ලේඛන පාවිච්චි කිරීම | 133 | 0 | | 11,500.00 |
| 19 | වෙනත් වැරදි | 1058714 | 835480 | 916,282,566.00 | 274,572,400.00 |
| | **මුළු එකතුව** | **2303638** | **1692705** | **1,904,882,414.00** | **3,603,783,385.00** |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය

## 2.5 වෙනත් මහජන සේවාවන්

ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රමුඛතම කාර්ය භාරය ඉටු කිරීමෙහිලා මහජනතාව වෙත ලබා දෙන විශේෂිත සේවාවන්ද පවතී. ඒ යටතේ මහජන පැමිණිළි සෘජුවම පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ සේවාවන්ද, 119 හදිසි ඇමතුම් සේවාවද, මහජනතාව වෙත නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ සේවාවද, පොලිස් කටයුතු සඳහා මහජන සහය සෘජුවම ලබා ගැනීමේ ප්‍රජා පොලිස් සේවාවද, දැක්විය හැකිය. මීට අමතරව විවිධ විරෝධතා ව්‍යාපාර සහ මහජන කැළඹිලි පවතින අවස්ථා වල පොදු ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ කැරළි මර්දන සේවාවන්ද ක්‍රියාත්මක කරනු ලබයි.

### 2.5.1 මහජන පැමිණිළි විසඳීමේ විශේෂිත සේවා

මහජන පැමිණිළි විසඳීම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් සිදු කිරීම සඳහා මහජන පැමිණිළි භාරගැනීමේ සහ විසඳීමේ සේවාවන් පළාත් මට්ටමින් සහ පොලිස් මූලස්ථානය ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මේ තුළින් ජනතාවට සිය පැමිණිළි පොලිස්පති වරයාට හෝ වෙනත් ඉහළ පොලිස් නිලධාරියකුට යොමු කොට සහනයක් ලබා ගත හැකිය. මෙම සේවාව සඳහා ලද මහජන පැමිණිළි පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

**වාර්තා වූ පැමිණිලි**

**වගු අංක 26**

| අනු අංකය | පැමිණිලි වර්ගය | 2021 | | | | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය |
| **1** | පොලිස්පති මහජන සහන දිනය | 16 | 7 | 9 | 44% | 33 | 17 | 16 | 52% | 245 | 20 | 225 | 8% |
| **2** | පොලිස් නිලධාරීන්ගේ සහන දිනය | 2900 | 2893 | 7 | 100% | 3091 | 2893 | 198 | 94% | 3620 | 3276 | 344 | 90% |
| **3** | "පොලිස්පතිට කියන්න" වැඩසටහන | 3432 | 1841 | 1591 | 54% | 2750 | 1290 | 1460 | 47% | 3869 | 1832 | 2037 | 47% |
| **4** | මහජන සහන මැදිරිය | 2095 | 1282 | 813 | 61% | 2110 | 876 | 1234 | 42% | 2387 | 1038 | 1349 | 43% |
| **එකතුව** | | **8443** | **6023** | **2420** | **71%** | **7984** | **5076** | **2908** | **64%** | **10121** | **6166** | **3955** | **61%** |

**මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය**

(**සැ.යු.** මෙහි විසඳූ යන්න මගින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ නඩු පැවරූ සංඛ්‍යාව, සමථ කළ සංඛ්‍යාව හෝ මුළුමනින්ම විසඳා අවසන් කළ සංඛ්‍යාව අදහස් වේ. පොලිස් නිලධාරීන්ගේ සහන දිනය සම්බන්ධයෙන්, විසඳූ යන්න මගින් පැමිණිලිකරුට සාධාරණ විසඳුමක් ලබා දීම අදහස් වේ)

## 2.5.1(අ) 119 හදිසි ඇමතුම් සේවාව

119 පොලිස් හදිසි ඇමතුම් සේවාව මහජනතාව අතර ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ සේවාවක් ලෙස දැක්විය හැකිය. මෙම සේවාව සඳහා ලැබෙන පැමිණිළි සංඛ්‍යාත්මකව ඉතා ඉහළ අගයක් ගනී. එම පැමිණිළි ලද වහාම අදාළ පොලිස් ස්ථානය වෙත බැහැර කරනු ලබන අතර, අදාළ පොලිස් ස්ථානය මගින් කඩිනමින් විමර්ශන ආරම්භ කරනු ලැබේ.

**වගු අංක 27** **119 වෙත වාර්තා වූ පැමිණිළි**

| වර්ෂය | වාර්තා වූ පැමිණිළි සංඛ්‍යාව | බැහැර කළ පැමිණිළි සංඛ්‍යාව |
|---|---|---|
| 2021 | 1,073,917 | 1,073,917 |
| 2022 | 962,642 | 962,642 |
| 2023 | 829132 | 829132 |

**මූලාශ්‍රය - පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාසය**

## 2.5.2 නිෂ්කාශන වාර්තා

දේශීය හා විදේශීය නිෂ්කාශන අයදුම්පත් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කරනු ලබන ඉතා වැදගත් කාර්යයක් ලෙස සැළකේ. 2023 වසරේ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම සම්බන්ධ ප්‍රගතිය පහත වගුව මගින් දක්වා ඇත.

**වගු අංක 28** **නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම**

| අයදුම්පත් වර්ගය | ලද අයදුම්පත් ප්‍රමාණය | නිකුත්කළ වාර්තා ප්‍රමාණය | ප්‍රතිශතය | නිකුත් කිරීමට ඇති වාර්තා ප්‍රමාණය | ලද මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|
| **දේශීය නිෂ්කාශන වාර්තා (Online)** | **11011** (රු.1500.00 බැගින්) | 223043 | 100% | 1113 | **16,516,500.00** |
| | 213145 (රු.4000.00 බැගින්) | | | | **852,580,000.00** |
| **විදේශීය නිෂ්කාශන වාර්තා (කානාපති කාර්යාල මගින්)** | 539 | 515 | 96% | 24 | **2,156,000.00** |
| **එකතුව** | **224695** | **223558** | 99% | **1137** | **871,252,500.00** |

**මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය**

## 2.5.3 ප්‍රජා පොලිස් සේවය

ප්‍රජා පොලිස් සේවය යනු පොලිසිය හා මහජනයා අතර නව සහයෝගීතාවයක් වර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගයකි. එමගින් ජනතාවට බලපාන අපරාධ, මත් උවදුර වැනි කාලීන ගැටළු හඳුනාගෙන ඒවා විසඳීම සඳහා පොලිසිය හා ප්‍රජාව එක්ව වැඩ කිරීම අපේක්ෂිතය. මූලිකවම මෙම ක්‍රියාවලිය ප්‍රජා පොලිස් කමිටු ඔස්සේ ක්‍රියාත්මක කෙරේ. 2023 වසරේ කමිටු පැවැත්වීම පිළිබඳ තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

**වගු අංක 29** **ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම**

| අනු අංකය | කොට්ඨාස සංඛ්‍යාව | සහිත්වූවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව | සහිත්වූවා ඇති කමිටු සංඛ්‍යාව | පැවැත්වීය යුතු කමිටු සංඛ්‍යාව | පවත්වා ඇති කමිටු සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ස්ථානාධිපති සහභාගී වීම් ගණන | දිස්ත්‍රික් හර පො.අ./ස.පො.අ. සහභාගී වීම් ගණන | කොට්ඨාස හර නිලධාරී සහභාගී වීම් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2023 වර්ෂයේ ප්‍රජා පොලිස් උපදේශන සභාව පැවැත්වීම | | | | | | | | | |
| 1 | 45 | 602 | 6020 | 6020 | 3848 | 41607 | 3233 | 1966 | - |
| 2023 වර්ෂයේ ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම | | | | | | | | | |
| 2 | 45 | 602 | 5418 | 5418 | 4167 | 145886 | 3553 | 2468 | - |
| 2023 වර්ෂයේ මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම | | | | | | | | | |
| 3 | 45 | 602 | 17030 | 17030 | 125985 | 1699886 | 30241 | - | - |

**මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය**



ප්‍රජා පොලිස් වෛද්‍ය සායන අවස්ථාවක්



ප්‍රජා පොලිස් වැඩමුළුවක අවස්ථාවක්

## 2.5.4 මහජන සාමය කළමනාකරණය

උද්ඝෝෂණ, අරගල, සත්‍යාග්‍රහ වැනි විවිධ ජන කණ්ඩායම් ඒකරාශී වන අවස්ථාවලදී එම පිරිස් ප්‍රකෝපකාරී සහ ප්‍රචණ්ඩකාරී වීමේ ඉඩකඩක් පවතී. එබඳු අවස්ථාවල මහජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කර ගනිමින් සාමය ආරක්ෂා කර ගැනීමේ වගකීම පොලීසිය සතුවේ. එබඳු අවස්ථා වල සද්භාවයෙන් කටයුතු කරමින් එම පිරිස් විසුරුවා හැරීම් සිදු කරනු ලබන අතර, 2023 වසරේ සිදු කළ විසිරුවා හැරීම් සහ එහිදී භාවිතා කළ මානව හා භෞතික සම්පත් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

**වගු අංක 30** **මහජන සාමය කළමනාකරණය**

| අනු අංකය | කාර්යය | යොදාගත් ප්‍රමාණය |
|---|---|---|
| 1 | කණ්ඩායම් යෙදවීම | 937 |
| 2 | කළහකාරී පිරිස් විසුරුවා හැරීම | 27 |
| 3 | කඳුළු වායු උණ්ඩ භාවිතය | 180 |
| 4 | කඳුළු වායුබෝම්බ භාවිතය | 98 |
| 5 | ජල ප්‍රහාරක රථ (ජල ප්‍රහාර එල්ල කර ඇති සංඛ්‍යාව) | 37 |
| 6 | මුළු ජල පරිමාව (ලීටර්) | 81200 |

**මූලාශ්‍රය - මහජන සාමය කළමනාකරණ කොට්ඨාසය**

## 2.6. පොලිස් වෛද්‍ය සේවාව

ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන් සඳහා ඉතා ගුණාත්මක සහ ඉහළ වෛද්‍ය පහසුකම් වලින් සමන්විත පොලිස් රෝහල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර, එමගින් පොලිස් නිලධරයන් මෙන්ම ඔවුන්ගේ පවුල් වල විශාල පිරිසකට සෙත සැලසේ.

2021 – 2023 දක්වා වසර 03 ක කාලයක් සඳහා පොලිස් රෝහල් මගින් ක්‍රියාත්මක කළ වෛද්‍ය සේවාවන් පිළිබඳ පහත වගුව මගින් තොරතුරු දක්වා ඇත.

**වගු අංක 31** **පොලිස් රෝහල් ආශ්‍රිත ප්‍රතිකාර සේවා**

| අනු අංකය | රෝගී තත්ත්වය | 2021 වසරේ රෝගීන් ප්‍රමාණය | 2022 වසරේ රෝගීන් ප්‍රමාණය | 2023 වසරේ රෝගීන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | දියවැඩියාව සහ රුධිර පීඩනය | කොරෝනා සමයේ සායන පවත්වා නොමැත | 92375 | 5363 |
| 2. | හෘද රෝග | | 9271 | 2495 |
| 3. | වෙනත් රෝග(සායන රෝගීන්) | 141467 | 22125 | 6479 |
| 4. | බාහිර රෝගීන් | 47430 | 103073 | 9256 |
| 5. | නේවාසික රෝගීන් | 4538 | 4678 | 5891 |
| **එකතුව** | | **193435** | **231522** | **29484** |

**මූලාශ්‍රය - පොලිස් වෛද්‍යසේවා කොට්ඨාසය**



**රුධිර කාන්දුකරන ඒකකය විවෘත කිරීම**



**ප්‍රතිකාර ලබා දීමේ අවස්ථාවක්**

## 2.6.1 පොලිස් නිලධරයන්ගේ මරණ

රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා බඳවා ගනු ලබන පොලිස් නිලධරයින් සඳහා සැලකිය යුතු පිරිවැයක් රජය විසින් දරනු ලබන අතර ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහාද විශේෂ අවධානයක් යොමු කෙරේ. මෙබඳු සන්දර්භයක් තුළ සෑම වසරකම සිදුවන පොලිස් නිලධරයන්ගේ මරණ පිළිබඳ අවධානය යොමු කිරීමේදී බෝ නොවන රෝග මගින් සිදු වන මරණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය. පහත වගුව මගින් පසුගිය වසර දෙකක පොලිස් නිලධරයන්ගේ මරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, එමගින් පොලිස් නිලධරයන්ගේ මරණ සිදු වීමට බලපෑ හේතු පිළිබඳ සන්සන්දනාත්මකව විමසා බැලිය හැකි වේ.

**පොලිස් නිලධරයන්ගේ මරණ**

**වගු අංක 32**

| අනු අංකය | මිය යාමට හේතුව | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 1 | විවිධ අසනීප | - | 58 | - | 63 |
| 2 | හෘදයාබාධ | - | 78 | - | 79 |
| 3 | පිළිකා | 2 | 18 | 2 | 18 |
| 4 | වකුගඩු ආබාධ | - | 33 | 1 | 18 |
| 5 | සියදිවි නසාගැනීම් | - | 10 | - | 11 |
| 6 | රිය අනතුරු | - | 42 | 1 | 30 |
| 7 | වෙනත් | - | 9 | - | 19 |
| **එකතුව** | | **2** | **248** | **4** | **238** |

**මූලාශ්‍රය - පොලිස් සුබසාධන කොට්ඨාසය**

## 2.7 බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරු කිරීම්.

පොලිස් රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ප්‍රමාණවත් මානව සම්පතක් සපයා ගැනීම සඳහා නිසි කලට බඳවාගැනීම් සිදුකරනු ලබන අතර, සේවයේ නියුතු මානව සම්පත සඳහා සේවා තෘප්තිය වර්ධනය කිරීමේ අරමුණින් සුදුසු පරිදි උසස්වීම් ක්‍රියාත්මක කෙරේ. කලින් කලට ස්ථානමාරුවීම්ද සිදු කරනු ලබන අතර, 2023 වසරට අදාළව සිදු කරන ලද බඳවා ගැනීම්, උසස් කිරීම් හා ස්ථානමාරු කිරීම් සම්බන්ධ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

**බඳවා ගැනීම්**

**වගු අංක 33**

| අනු අංකය | තනතුර | ඌ.පොා.ප. | කා.ඌ.පොා.ප. | පොා.කොා. | කා.පොා.කොා. | පොා.කොා.රී. | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය පොලිස් රාජකාරී | 116 | - | 1184 | - | 39 | **1339** |
| 2 | විශේෂ කාර්ය බලකාය | 125 | - | - | - | 253 | **378** |
| 3 | සහායක සේවා | - | - | - | - | - | **0** |
| **මුළු එකතුව** | | **241** | **0** | **1184** | **0** | **292** | **1717** |

**මූලාශ්‍රය - බඳවාගැනීම් කොට්ඨාසය**



නවක නිලධාරීන් විසිර යෑමේ අවස්ථාවක්



නවක නිලධාරීන් ඇඟයීමේ අවස්ථාවක්

වගු අංක 34

## උසස් කිරීම්

| අනු අංකය | නිලය | සාමාන්‍ය සේවය | | විශේෂ කාර්ය බලකාය | | සහායක සේවය | |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරීන් | නිලධාරිණියන් | නිලධාරීන් | නිලධාරිණියන් | නිලධාරීන් | නිලධාරිණියන් |
| 1 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 5 | - | 1 | - | - | - |
| 2 | නියෝජ්‍ය පොලිස්පති | - | - | - | - | - | - |
| 3 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 53 | - | 4 | - | 1 | - |
| 4 | පොලිස් අධිකාරී | 40 | - | 12 | - | - | - |
| 5 | සහකාර පොලිස් අධිකාරී | 13 | - | - | - | - | - |
| 6 | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 20 | 2 | 3 | - | 8 | 1 |
| 7 | පොලිස් පරීක්ෂක | 230 | - | 50 | - | 42 | 5 |
| 8 | උප පොලිස් පරීක්ෂක | 1566 | 597 | 114 | - | 2 | 6 |
| 9 | උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 6 | - | 11 | - | - | - |
| 10 | පොලිස් සැරයන් | 4889 | 414 | 506 | - | 90 | 3 |
| 11 | පොලිස් සැරයන් රියදුරු | 108 | - | 7 | - | - | - |
| **එකතුව** | | **6930** | **1013** | **708** | **0** | **143** | **15** |

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

වගු අංක 35 **ස්ථානමාරු කිරීම්**

| අනු අංකය | නිලය | නිලධාරීන් | නිලධාරිණියන් | එකතුව |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 21 | - | 21 |
| 2 | නියෝජ්‍ය පොලිස්පති | 45 | - | 45 |
| 3 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 84 | 2 | 86 |
| 4 | පොලිස් අධිකාරී | 39 | - | 39 |
| 5 | සහකාර පොලිස් අධිකාරී | 93 | 2 | 95 |
| 6 | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 139 | 6 | 145 |
| 7 | පොලිස් පරීක්ෂක | 164 | 6 | 170 |
| 8 | උප පොලිස් පරීක්ෂක | 455 | 49 | 504 |
| 9 | පොලිස් සැරයන් | 7 | - | 7 |
| 10 | පොලිස් කොස්තාපල් | 1150 | 56 | 1206 |
| 11 | පොලිස් සැරයන් රියදුරු | 2100 | 753 | 2853 |
| 12 | පොලිස් කොස්තාපල් රියදුරු | 81 | - | 81 |
| 13 | පොලිස් ආරක්ෂක සහයක | 460 | - | 460 |
| **එකතුව** | | **4838** | **874** | **5712** |

**මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය**

## 2.8 භෞතික සම්පත් සංවර්ධනය.

ආයතනයක් සතු මානව සම්පත උපරිම කාර්යක්ෂම මට්ටමට ලඟා කර ගනිමින් සේවා ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා භෞතික සම්පත් අවශ්‍ය ප්‍රමාණයට සපයා ගැනීම වැදගත් සාධකයකි. ශ්‍රී ලංකා පොලීසිය මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වාර්ෂිකව විශාල පිරිවැයක් දරමින් ගොඩනැගිලි ඉදිකිරීම් සහ අළුත්වැඩියා කිරීම් නව පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස, මුරකුටි ආරම්භ කිරීම, රථවාහන මිලදී ගැනීම්, නඩත්තු කටයුතු සහ පොලිස් රාජකාරි සඳහා අවශ්‍ය අනෙකුත් භාණ්ඩ හා සේවා සපයා ගැනීම සිදු කරනු ලබයි. ඒ යටතේ භෞතික සම්පත් සංවර්ධනයට අදාළ 2023 වසරේ කාර්ය සාධනය පහත අයුරින් වේ.

### 2.8.1 ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම්.

**වගු අංක 36**

**නව ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් ප්‍රගතිය**

| අනු අංකය | ගොඩනැගිලි වර්ගය | ප්‍රමාණය | සමස්ථ ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල (රු.මි.) | 2023 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | 2023.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | පොලිස් ස්ථාන ඉදි කිරීම් | 9 | 1548.09 | 72.77 | 53.64 |
| 2 | භට නිවාස ඉදි කිරීම් | 6 | 1738.85 | 76.33 | 80.13 |
| 3 | නිල නිවාස ඉදි කිරීම් | 5 | 834.88 | 131 | 107.95 |
| 4 | වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් | 6 | 1340.71 | 60.9 | 53.04 |
| 5 | වෙනත්ගෙවීම් | 8 | - | - | 33.95 |
| 6 | පොලිස් ස්ථාන අලුත්වැඩියා කිරීම | 25 | 416.38 | 152.19 | 87.52 |
| 7 | භට නිවාස අලුත්වැඩියා කිරීම | 5 | 18.68 | 13.52 | 7.44 |
| 8 | නිල නිවාස අලුත් වැඩියා කිරීම. | 27 | 244.73 | 99.54 | 38.42 |
| 9 | වෙනත් අලුත්වැඩියා කිරීම් | 56 | 663.03 | 284.75 | 143.31 |
| 10 | වෙනත්ගෙවීම් | - | - | - | 44.56 |
| **එකතුව** | | **147** | **6805.35** | **891** | **649.96** |

**මූලාශ්‍රය - ගොඩනැගිලි කොට්ඨාසය**

## 2.8.2 පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස හා මුරකුටි ආරම්භ කිරීම.

2023 වසර තුළ ආරම්භ කරන ලද පොලිස් ස්ථාන, පොලිස් ක්‍රියාකාරී කොට්ඨාස, පොලිස් ප්‍රාදේශීය කොට්ඨාස සහ පොලිස් මුරකුටි සංඛ්‍යාව වගු අංක 37 මගින් දක්වා ඇති අතර, 2023.12.31 දිනට සමස්ථ පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස, දිස්ත්‍රික්ක හා මුරකුටි සංඛ්‍යාවද එමගින් දක්වා ඇත.

**වගු අංක 37** **පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස හා මුරකුටි**

| | පොලිස් ස්ථාන | ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස | ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස | සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක | පොලිස් මුරකුටි |
|---|---|---|---|---|---|
| 2023 වර්ෂය තුළ ආරම්භ කළ සංඛ්‍යාව | 1 | 1 | - | - | 1 |
| 2023.12.31 දිනට මුළු සංඛ්‍යාව | 607 | 78 | 45 | 196 | 260 |
| ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත සංඛ්‍යාව | 91 | - | 1 | - | - |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

## 2.8.2(අ) පොලිස් ස්ථාන ශ්‍රේණිගත කිරීම්

**වගු අංක 38** **ශ්‍රේණිගත කිරීම්**

| 2023.12.31 දිනට දිවයිනේ සියළු පොලිස් ස්ථාන පහත පරිදි ශ්‍රේණිගත කොට ඇත | | |
|---|---|---|
| **අනු අංකය** | **ශ්‍රේණිය** | **පොලිස් ස්ථාන ගණන** |
| 1 | A 1 අධි ශ්‍රේණිය | - |
| 2 | A1 | 82 |
| 3 | A2 | 103 |
| 4 | A3 | 142 |
| 5 | B | 152 |
| 6 | C | 74 |
| 7 | D | 54 |
| **එකතුව** | | **607** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

## 2.8.3 ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන.

2023 වසරේ ශ්‍රී ලංකා පොලීසිය වෙත මිලදී ගත් රථ වාහන සහ 2023.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතුව පවතින සමස්ථ වාහන සංඛ්‍යාව සහ වාහන අළුත්වැඩියා කිරීම් පිළිබඳ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

**වගු අංක 39** **2023 වසරේ වාහන මිලදී ගැනීම්**

| වාහන වර්ගය | ප්‍රමාණය | ගෙවූ මුදල (රු.මි.) |
|---|---|---|
| ටොයෝටා හයිඑස් වෑන් (ශ්‍රී ලංකා රේගුව වෙතින්) | 1 | 0.9 (ප්‍රමාද ගාස්තු පමණක් ගෙවා ඇත) |
| නිසාන් NV200 (ශ්‍රී ලංකා රේගුව වෙතින්) | 1 | 0.8 (ප්‍රමාද ගාස්තු පමණක් ගෙවා ඇත) |
| **මුලු මුදල** | | **1.7** |

**වගු අංක 40** **2023 වසරේ වාහන අළුත්වැඩියා කිරීම්**

| අනු අංකය | ප්‍රධාන හා උප ගරාජය | අළුත්වැඩියාවන් ගණන | | |
|---|---|---|---|---|
| | | සුළු අළුත්වැඩියා | ප්‍රධාන අළුත්වැඩියා | ජංගම අළුත්වැඩියා |
| 1 | නාරාහේන්පිට ප්‍රධාන ගරාජය | | | |
| | බාහිර අළුත්වැඩියා අංශය | 319 | 40 | - |
| | හදිසි අළුත්වැඩියා අංශය | 7750 | - | - |
| | රථවාහන විවිධ අළුත්වැඩියා අංශය | 151 | 95 | - |
| | ප්‍රධාන ගරාජය | - | 6950 | 1060 |
| 2 | මාතර උප ගරාජය | 2832 | 38 | 1514 |
| 3 | කළුතර උප ගරාජය | 1378 | 31 | 340 |
| 4 | ඕපනායක උප ගරාජය | 461 | 43 | 22 |
| 5 | වව්නියාව උප ගරාජය | 1967 | 59 | 436 |
| 6 | කුඹුඩසාලය උප ගරාජය | 1589 | 82 | 616 |
| 7 | අම්පාර උප ගරාජය | 2324 | 53 | 1128 |
| 8 | බිංගිරිය උප ගරාජය | 1103 | 91 | 482 |
| 9 | අනුරාධපුරය උප ගරාජය | 1501 | 61 | 451 |
| 10 | කන්කසන්තුරය උප ගරාජය | 762 | 22 | 94 |
| 11 | ත්‍රිකුණාමලය උප ගරාජය | 1165 | 31 | 236 |
| **එකතුව** | | **23302** | **7596** | **6379** |

**මූලාශ්‍රය - ප්‍රවාහන කොට්ඨාසය**

වගු අංක 41 **2023.12.31 වන දිනට ශ්‍රී ලංකා පොලිසිය සතු වාහන/යතුරුපැදි**

| අනු අංකය | වාහන වර්ගය | පොලිස්පති යටතේ ලියාපදිංචි කළ වාහන | අණදෙන නිලධාරී විශේෂ කාර්ය බළකාය යටතේ ලියාපදිංචි කළ වාහන | එකතුව |
|---|---|---|---|---|
| 1 | ජීප් රථ | 1721 | 265 | 1986 |
| 2 | කාර් රථ | 755 | 63 | 818 |
| 3 | ගුවන්විදුලි කාර් රථ | 118 | 0 | 118 |
| 4 | සින්ගල් කැබ් රථ | 602 | 91 | 693 |
| 5 | ඩබල් කැබ් රථ | 184 | 24 | 208 |
| 6 | වෑන් රථ | 101 | 24 | 125 |
| 7 | ගිලන් රථ | 42 | 14 | 56 |
| 8 | ට්‍රක් රථ | 94 | 65 | 159 |
| 9 | ඩීමෝ බට්ටා රථ | 5 | 0 | 5 |
| 10 | බස් රථ | 143 | 45 | 188 |
| 11 | ජලබවුසර් රථ | 69 | 31 | 100 |
| 12 | ටැක්ටර් රථ | 120 | 57 | 177 |
| 13 | අත්ටැක්ටර් රථ | 28 | 12 | 40 |
| 14 | ගලි බවුසර් රථ | 13 | 2 | 15 |
| 15 | ත්‍රී රෝද රථ | 2334 | 42 | 2376 |
| 16 | යතුරු පැදි | 4346 | 414 | 4760 |
| 17 | අසුන් ප්‍රවාහන ට්‍රක් රථ | 5 | 0 | 5 |
| 18 | නිල සුනඛ රථ | 20 | 0 | 20 |
| 19 | ජල ප්‍රහාරක රථ | 12 | 3 | 15 |
| 20 | යුධ රථ | 2 | 50 | **52** |
| 21 | ආපදා රථ | 9 | 0 | 9 |
| 22 | යුනිකෝන් රථ | 2 | 3 | 5 |
| 23 | බුම්ට්‍රක් රථ | 3 | 0 | 3 |
| 24 | බෝට්ටු | 25 | 8 | 33 |
| 25 | බැකෝ/ බුල්ඩෝසර්/ කැටපිලර් | 5 | 4 | 9 |
| 26 | ෆෝක් ලිෆ්ට් රථ | 10 | 2 | 12 |
| 27 | බීච් රෝවර් රථ | 5 | 0 | 5 |
| 28 | ජංගම වැඩ රථ | 4 | 1 | 5 |
| 29 | ජංගම විවේක රථ | 1 | 0 | 1 |
| 30 | ටැක්ටර් ට්‍රෙලර් | 136 | 57 | 193 |
| 31 | ටැක්ටර් ට්‍රෙලර් බවුසර් රථ | 68 | 22 | 90 |
| 32 | ටැක්ටර් ගලි රථ | 5 | 6 | 11 |
| 33 | ගිනි නිවන රථ | 1 | 0 | 1 |
| 34 | ට්‍රිපර් රථ | 1 | 3 | 4 |
| 35 | ජංගම සෝදිසි රථ | 2 | 0 | 2 |
| 36 | ගල් රෝල | 1 | 0 | 1 |
| 37 | කැරියර් රථ | 0 | 17 | 17 |
| 38 | දියගොඩ රථ | 0 | 2 | 2 |
| 39 | බාධක | 0 | 3 | 3 |
| එකතුව | | **10992** | **1330** | **12322** |

**මූලාශ්‍රය - ප්‍රවාහන කොට්ඨාසය**

## 2.8.4 වෙනත් භෞතික සම්පත්.

අපරාධ විමර්ශනය, රථ වාහන පාලනය, පුහුණු කටයුතු සහ පෙර ගමන් රාජකාරී ඇතුළු විවිධ උත්සව අවස්ථා සඳහා යොදාගනු ලබන නිල සුනඛයින් සහ අශ්වයින්ද ශ්‍රී ලංකා පොලීසිය සතු ඉතා වැදගත් භෞතික සම්පත් වේ. ඔවුන්ගේ සේවාව ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විශාල පිරිවැයක් දරනු ලබන අතර, 2023.12.31 දිනට මෙම වත්කම් සම්බන්ධ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

**වගු අංක 42** **ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයින්**

| අනු අංකය | විස්තරය | වර්ෂය | ප්‍රමාණය | එක් සුනඛයකුගේ වටිනාකම | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| 1 | විදේශයෙන් ආනයනය කරන ලද සුනඛයින් | 2015 | 17 | 1,044,000.00 | 17,748,000.00 |
| | | 2018 | 29 | 1,041,915.88 | 30,215,560.52 |
| 2 | දැනට සිටින පරිත්‍යාග ලද සුනඛයින් | | 128 | 15,000.00 | 1,920,000.00 |
| 3 | නිල සුනඛ කොට්ඨාසයේ අභිජනනය කර ලබාගත් සුනඛයින් | | 76 | 15,000.00 | 1,140,000.00 |
| 4 | දේශීයව මිල දී ගත් සුනඛයින් | | 5 | 15,000.00 | 75,000.00 |
| 5 | දැනට සිටින නිල සුනඛයින් සංඛ්‍යාව | | 255 | - | 51,098,560.52 |

**මූලාශ්‍රය - නිල සුනඛ කොට්ඨාසය**

**වගු අංක 43** **ශ්‍රී ලංකා පොලීසිය සතු අශ්වයින්**

| අනු අංකය | අශ්වයින් ප්‍රමාණය | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| 1 | වයස අවුරුදු 20 වැඩි අශ්වයින් 01යි | 1,755,967.30 |
| 2 | වයස අවුරුදු 18 - 20 අශ්වයින් 06යි | 13,987,319.70 |
| 3 | වයස අවුරුදු 14 - 17 අශ්වයින් 10යි | 27,273,770.90 |
| 4 | වයස අවුරුදු 11 - 13 අශ්වයින් 06යි | 18,557,835.00 |
| 5 | වයස අවුරුදු 08 - 10 අශ්වයින් 13යි | 49,384,140.00 |
| **එකතුව** | **36** | **110,959,032.90** |

**මූලාශ්‍රය - අශ්වාරෝහක කොට්ඨාසය**

## 2.8.5 ඉඩම් සහ ගොඩනැගිලි පරිහරණය.

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල, භට නිවාස, නිල නිවාස සහ අනෙකුත් විවිධ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන ගොඩනැගිලි වල අයිතියේ ස්වභාවය සහ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන මාසික සහ වාර්ෂික මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු වගු අංක 44 මගින් දක්වා ඇත.

**වගු අංක 44** **ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් සහ ගොඩනැගිලි**

| 2023.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් ප්‍රමාණය | | | | 2023.12.31 වන දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි ප්‍රමාණය | | කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා 2023 වර්ෂය තුළ ගෙවා ඇති මුදල් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථානය | ඉඩම් ප්‍රමාණය | | | | | ගොඩනැගිලි ලබාගෙන ඇති කාර්යය | ප්‍රමාණය | මාසිකව ගෙවනු ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.) | වාර්ෂිකව ගෙවනු ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.) |
| | අක්කර | රූඩ් | පර්චස් | | | | | | |
| පොලිස් ස්ථාන - 451 | 1209 | 3 | 9.1 | පොලිස් කාර්යාල | 80 | පොලිස් කාර්යාල | 80 | 40,884,472.33 | 490,613,667.96 |
| පොලිස් කාර්යාල/ මුරපොල/ නිල නිවාස/ සංචාරක නිවාස සහ වෙනත් - 251 | 652 | 2 | 26.7 | පොලිස් ස්ථාන | 123 | පොලිස් ස්ථාන | 123 | 9,180,903.33 | 110,170,839.96 |
| **එකතුව - 702** | **1861** | **5** | **35.8** | පොලිස් මුරපොල | 13 | පොලිස් මුරපොල | 13 | 174,822.50 | 2,097,870.00 |
| | | | | නිල නිවාස හා භට නිවාස | 104 | නිල නිවාස හා භට නිවාස | 104 | 7,891,552.25 | 94,698,627.00 |
| | | | | වෙනත් | 9 | වෙනත් | 9 | 1,129,666.67 | 13,556,000.04 |
| | | | | **මුළු එකතුව** | **329** | **මුළු එකතුව** | **329** | **59,261,417.08** | **711,137,004.96** |

**මූලාශ්‍රය - දේපළ කළමනාකරණ කොට්ඨාසය**

## 2.8.6 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ ප්‍රගතිය.

පොලිස් රාජකාරි යටතට ගැනෙන සියලුම කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කර ගැනීම සඳහා ඉවහල් වන භාණ්ඩ හා සේවාවන් රාශියක් ශ්‍රී ලංකා පොලිසිය විසින් සෑම වසරකම සපයා ගනු ලැබේ. නිලධරයින් බඳවාගැනීමේ සිට ඔවුන් පුහුණු කිරීම, ඔවුන් සේවයේ යෙදවීම මෙන්ම අපරාධ විමර්ශන, කැරලි මර්දන, මත්ද්‍රව්‍ය නිවාරණ ආදී සියලුම පොලිස් කාර්යයන් සඳහා අවශ්‍ය කරනු ලබන භාණ්ඩ හා සේවා මේ යටතේ සපයා ගනු ලැබේ. ශ්‍රී ලංකා පොලීසිය 2023 වසරේ භාණ්ඩ හා සේවා සපයා ගැනීම පිළිබඳ තොරතුරු පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 45** **භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සම්බන්ධ මූල්‍යමය වාර්තාව**

| අනු. අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | 2023 වර්ෂයේ ලද ප්‍රතිපාදන | වියදම (රු.මි.) (2023.12.31) | අතැති බිල් | මේ වන විට ප්‍රගතිය (%) (2023.12.31) |
|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්ථන වියදම** | | | | | |
| 1 | 225-1-1-0-1201 | **ලිපි ද්‍රව්‍ය** | 2,945,025.00 | 2,255,896.57 | - | 77% |
| **එකතුව (රුපියල්)** | | | **2,945,025.00** | **2,255,896.57** | **-** | |
| 2 | 225-1-1-0-1203-(1) | නිල ඇඳුම් | 2,492,520,898.17 | 2,039,850,438.06 | - | 86% |
| 3 | 225-1-1-0-1203-(5) | සත්ත්ව ආහාර | | 100,533,956.96 | | |
| **එකතුව (රුපියල්)** | | | **2,492,520,898.17** | **2,140,384,395.02** | **-** | |
| 4 | 225-1-1-0-1205-(5) | ගබඩා උපකරණ | 337,221,996.50 | 126,397,750.92 | - | 100% |
| 5 | 225-1-1-0-1205-(6) | උණ්ඩ | | 138,665,192.00 | - | |
| 6 | 225-1-1-0-1205-(7) | ඇඟිලි සළකුණු ද්‍රව්‍ය | | 31,680,660.00 | - | |
| 7 | 225-1-1-0-1205-(8) | ඡායාරූප ද්‍රව්‍ය | | 39,666,200.00 | - | |
| **එකතුව (රුපියල්)** | | | **337,221,996.50** | **336,409,802.92** | **-** | |
| | 225-1-1-0-1409-(10) | පුවත්පත් දැන්වීම් සඳහා යන වියදම් | 4,759,443.97 | 3,766,728.40 | - | 100% |
| | 225-1-1-0-1409-(11) | ප්‍රසම්පාදන කමිටු සඳහා යන වියදම් | | 992,715.57 | - | |
| **එකතුව (රුපියල්)** | | | **4,759,443.97** | **4,759,443.97** | **-** | |
| **පුනරාවර්ථන වියදම් එකතුව (රුපියල්)** | | | **2,837,447,363.64** | **2,483,809,538.48** | **-** | |
| | **ප්‍රාග්ධන වියදම්** | | | | - | |
| 12 | 225-1-1-0-1202-(1) | ගෘහ උපකරණ | 408,593,332.24 | 81,981,552.92 | - | 98% |
| 14 | 225-1-1-0-1202-(3) | සුභ සාධන | | 698,091.25 | | |
| 15 | 225-1-1-0-1202-(4) | කාර්යාල උපකරණ | | 2,259,153.00 | | |
| 16 | 225-1-1-0-1202-(5) | විදුලි උපකරණ | | 40,763,372.04 | | |
| 17 | 225-1-1-0-1202-(6) | පරිගණක | | 273,727,764.25 | | |
| **එකතුව (රුපියල්)** | | | **408,593,332.24** | **399,429,933.46** | **-** | |
| 18 | 225-1-1-0-1203-(1) | අවි | 257,982,578.78 | 234,882,578.78 | - | 97% |
| 22 | 225-1-1-0-1203-(5) | ඇඟිලි සළකුණු උපකරණ | | 2,418,450.00 | | |
| 25 | 225-1-1-0-1203-(8) | අශ්වයින් සඳහා අවශ්‍ය උපකරණ | | 6,604,665.25 | | |

| අනු. අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | 2023 වර්ෂයේ ලද ප්‍රතිපාදන | වියදම (රු.මි.) (2023.12.31) | අතැති බිල් | මේ වන විට ප්‍රගතිය (%) (2023.12.31) |
|---|---|---|---|---|---|---|
| 26 | 225-1-1-0-1203-(9) | නිල සුනඛයින් සඳහා අවශ්‍ය උපකරණ | | 2,607,360.00 | | |
| 27 | 225-1-1-0-1203-(17) | වෙනත් උපකරණ | | 2,539,970.00 | | |
| **එකතුව (රුපියල්)** | | | **257,982,578.78** | **249,053,024.03** | **-** | |
| **ප්‍රාග්ධන වියදම් එකතුව (රුපියල්)** | | | **666,575,911.02** | **648,482,957.49** | **-** | |
| **මුළු එකතුව (රුපියල්)** | | | **3,504,023,274.66** | **3,132,292,495.97** | **-** | |

**මූලාශ්‍රය - සැපයුම් කොට්ඨාසය**

## 2.9 ශ්‍රී ලංකා පොලිසියේ ඉදිරි ඉලක්ක.

ශ්‍රී ලංකා පොලිසිය සිය කාර්යභාරයන් ඉදිරියේදී වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා ඉලක්කගත ව්‍යාපෘති හා වැඩසටහන්, අපරාධ මර්දනය, මත් උවදුර මැඩලීම නව තාක්ෂණික උපාය මාර්ග භාවිතය, රිය අනතුරු අවම කිරීම, භෞතික හා මානව සම්පත් සංවර්ධනය යන අංශ යටතේ පහත අයුරින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

### 2.9.1 අපරාධ විමර්ශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ඉදිරි ඉලක්ක.

i. නොවිසඳුණු අපරාධ විසඳීම සඳහා ස්වයංක්‍රීය ඇඟිලි සටහන් හඳුනාගැනීමේ පද්ධතියෙහි උපරිම දායකත්වය ලබා ගැනීම.

ii. දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් පරීක්ෂා කිරීමේ කටයුතු නව ක්‍රමෝපායන් භාවිතා කරමින් සිදු කිරීම.

iii. අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමේ කටයුතු නව තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් එහි ඵලදායී මට්ටම තවදුරටත් ඉහළ නැංවීම.

iv. අපරාධ ස්ථාන මගින් ලබා ගන්නා තොරතුරුවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ලබා ගන්නා සටහන් එම ස්ථානයේ සිටම විශ්ලේෂණ කාර්යයන් සඳහා ක්ෂණිකව යොමු කිරීමේ තාක්ෂණය යොදා ගැනීම මගින් අපරාධ විමර්ශන කටයුතු වේගවත් කිරීම.

v. සංවිධානාත්මක අපරාධ විමර්ශන කටයුතු සාර්ථකව සිදුකිරීම සඳහා ඒ හා සම්බන්ධ දත්ත විශ්ලේෂණ කටයුතු පරිගණක තාක්ෂණය යොදාගෙන සිදු කිරීම.

vi. ළමයින්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ සහ හිංසන ක්‍රියා පිළිබඳ පැමිණිලි විමර්ශනය හා අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම සම්බන්ධ සමස්ථ ක්‍රියාවලිය පූර්ණ ලෙස නියාමනය කිරීම තුළින් යුක්තිය පසිඳලීම වේගවත් කිරීම.

vii. අන්තර්ජාල හා පරිගණක අපරාධ වලින් ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීම ඇතුළු අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

viii. විෂ මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීමේදී ප්‍රධාන ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන රහසිගත මෙහෙයුම් සඳහා අවශ්‍ය නීති අනුමත කර ගැනීම.

ix. විෂ මත්ද්‍රව්‍ය ඒකක ස්ථාපිත කිරීම මගින් මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සහ සියලුම වරායන් හා ගුවන් තොටුපල වල මෙම ඒකක ස්ථාපිත කිරීම මගින් මෙරටට විෂ මත්ද්‍රව්‍ය ඇතුළු වීම පාලනය කිරීම.

x. පාසල් අවට මත්ද්‍රව්‍ය වලින් තොර කලාපයක් බිහි කිරීම සඳහා “පවුර සංසදය” නමින් කමිටු ස්ථාපිත කිරීම මගින් පාසල් දරුවන් මත් උවදුරින් මුදවා ගැනීම.

## 2.9.2 රිය අනතුරු වැලැක්වීම සම්බන්ධ ඉදිරි ඉලක්ක.

i. අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු අවම කිරීම සඳහා රිය අනතුරු සිදු වීමේ වැඩි සම්භාවිතාවක් ඇති ධාවන වේලාවන් සහ අනෙකුත් කරුණු පිළිබඳ රියදුරන් දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ii. රිය අනතුරු වැළැක්වීම සඳහා සෑම ආකාරයේම නව තාක්ෂණික උපායමාර්ග භාවිතය සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණික මෙවලම් භාවිතය ප්‍රවර්ධනය කිරීම.

iii. මත්ද්‍රව්‍ය ලබාගෙන රිය පදවන රියදුරන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ උපකරණ බස්නාහිර හා දකුණු පළාත් කොට්ඨාස වෙත ලබා දී නිලධාරීන් පුහුණු කර ඇති අතර, එය දිවයින පුරාම කඩිනමින් ක්‍රියාත්මක කෙරේ.

iv. රිය අනතුරු අවම කර ගැනීමේ ඉතා වැදගත් පියවරක් වන දැනුවත් කිරීම් සිදු කිරීම යටතේ සමාජයේ සෑම ස්ථරයක්ම නියෝජනය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදු කිරීම.

v. රිය අනතුරු අවම කිරීමේ ඉලක්කගත වැඩ පිළිවෙල ඔස්සේ 2023 වසරේ මාරක රිය අනතුරු 8% කින් අඩු කරගෙන ඇති අතර,ඉදිරියේදී මාරක අනතුරු ඇතුළු සමස්ථ අනතුරු ප්‍රමාණය කැපී පෙනෙන ලෙස අඩු කර ගැනීම.

vi. විවිධ දැනුවත්කිරීම්, ප්‍රදර්ශන කුටි, සන්දර්ශන ඉතා ඉහළ මට්ටමකින් පවත්වා රිය අනතුරු 20% කින් අඩු කර ගැනීමේ ඉලක්කය ඉතා කෙටි කාලයක් තුළ සපුරා ගැනීම.

vii. බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ රථවාහන මෙහෙයුම් ඉතා පුළුල් ආකාරයෙන් සිදු කිරීම.

viii. රිය අනතුරු දත්ත උපයෝගී කර ගනිමින්, විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ විශ්ලේෂණාත්මකව රිය අනතුරු බහුල ප්‍රදේශ හඳුනාගෙන ඊට හේතු වූ විවිධ කරුණු අධ්‍යයනය කොට පිළියම් යෙදීමේ ක්‍රමවේදය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම. මේ සඳහා යොදාගනු ලබන රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතියේ කටයුතු කඩිනමින් අවසන් කිරීම.

ix. රිය අනතුරු සඳහා බලපානු ලබන ධාවනයට නුසුදුසු වාහන පරීක්ෂා කොට තහනම් නියෝග නිකුත් කිරීමේ මෙහෙයුම් තවදුරටත් පුළුල් කිරීම.

x. මාර්ග තදබදය අවම කිරීම සඳහා එක් දිශාවකට රථවාහන ධාවනය පිළිබඳව තවදුරටත් පුළුල් ලෙස අධ්‍යයනය කර අවශ්‍ය කෙටි කාලීන සහ දිගු කාලීන විසඳුම් ඉදිරිපත් කිරීම.

xi. රථවාහන වැරදි සඳහා දඩමුදල් ගෙවීම දුරකථනය මගින් සිදු කිරීමේ පහසුකම කඩිනමින් ලබාදීම මගින් එම ක්‍රියාවලිය සරල කිරීම.

xii. සෑම පොලිස් ස්ථානයකටම වීඩියෝ සහ නවීන වේගමාපක යන්ත්‍ර ලබා දීම මගින් වේග සීමාවන් පිළිබඳ ඉතා නිවැරදි තොරතුරු ලබා ගැනීම

xiii. මාර්ගවල රාජකාරී කරනු ලබන සෑම රථවාහන නිලධරයෙකුටම නිල ඇඳුමේ පැළඳිය හැකි කැමරාවක් ලබා දීම.

## 2.9.3 මානව සම්පත් සංවර්ධනය සම්බන්ධ ඉදිරි ඉලක්ක.

i. එක්සත් ජාතීන්ගේ සාම සාධක පොලිස් බලමුළු රාජකාරි සඳහා විශේෂ කාර්ය බළකා නිලධාරීන් යොමු කිරීම.

ii. ලෝකයේ පවතින නවීන පොලිස් ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන්ට දැනුම ලබා දීම සඳහා දෙස් විදෙස් පාඨමාලා වෙත ඔවුන් යොමු කිරීම.

iii. පොලිස් නිලධරයන්ගේ පරිගණක දැනුම ඉහළ දැමීම සඳහා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන මගින් අවශ්‍ය විෂය දැනුම ලබා දීම.

iv. වර්ථමාන සමාජයට ගැළපෙන න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලත් දක්ෂ පොලිස් නිලධරයෙකු පොලිස් රාජකාරී සඳහා යොමු වන බවට සහතික වනු පිණිස දැනට පොලිස් අභ්‍යාස ආයතනය, පොලිස් විද්‍යාල සහ සේවස්ථ පුහුණු ආයතන මගින් සිදු කරනු ලබන පුහුණු පාඨමාලා වැඩිදියුණු කිරීම.

v. ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීමෙහි නියුතු නිලධරයන්ගේ දැනුම කුසලතා වර්ධනය සඳහා පාඨමාලා, වැඩමුළු ක්‍රියාත්මක කිරීම.

vi. නව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුගමනය කරමින් නිසි කලට බඳවාගැනීම් හා උසස් කිරීම් සිදු කර පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

vii. ඉදිරියේදී සිදු කිරීමට නියමිත බඳවාගැනීම් පහත පරිදි ක්‍රියාත්මක කෙරේ.

**වගු අංක 46** **ඉදිරියට නියමිත බඳවා ගැනීම්**

| අනු. අංකය | නිලය | බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව | | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | 2024 | 2025 යෝජිත | |
| 1 | පොලිස් කොස්තාපල් | 4050 | | 2024 වර්ෂයට තනතුරු 500 ක් බඳවාගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. |
| 2 | කාන්තා පොලිස් කොස්තාපල් | 650 | | |
| 3 | පොලිස් කොස්තාපල් රියදුරු | 150 | | |
| 4 | උප පොලිස් පරීක්ෂක | 150 | | |
| 5 | කාන්තා උප පොලිස් පරීක්ෂක | | | |
| එකතුව | | 5000 | - | - |

**මූලාශ්‍රය - බඳවාගැනීම් කොට්ඨාසය**

viii. ශ්‍රී ලංකා පොලීසියේ කාන්තා නියෝජනය 15% ක් දක්වා වැඩි කිරීම සඳහා කාන්තා තනතුරු වල අනුමත සංඛ්‍යාව වැඩි කිරීම.

ix. නිලධරයන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය වර්ධනය කිරීම සඳහා විවිධ ඝායන පැවැත්වීම සහ භෝජනාගාරවල සෞඛ්‍යාරක්ෂිත ආහාර වට්ටෝරු සකස් කිරීම තුළින් බෝ නොවන රෝග වලින් මුදවා ගැනීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම.

## 2.9.4 භෞතික සම්පත් සංවර්ධන ඉලක්ක.

i. නියෝජ්‍ය පොලිස්පති බල ප්‍රදේශ, පරිපාලන දිස්ත්‍රික්කවල මායිම් වලට සමපාත වන පරිදි සීමා නිර්ණය කර අවසන් කිරීම.

ii. සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක සීමා නිර්ණය කර ගැසට්පත්‍රය මගින් ප්‍රකාශ කිරීම.

iii. ශ්‍රී ලංකා පොලීසියේ ඉතිහාසයට අයත් වැදගත් අංග විදහා දක්වන ඡායාරූප ඇතුළත් ගැලරියක් ආරම්භ කිරීම.

iv. පොලිස් ප්‍රවාහන කොට්ඨාසයේ කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා ප්‍රවාහන උප ඒකක ස්ථාපිත කිරීම.

v. පොලිස් ප්‍රවාහන පද්ධතිය පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංගමයේ සම්බන්ධීකරණය යටතේ රථවාහන ලබා ගැනීම.

vi. සිදු කිරීමට නියමිත ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම් පහත පරිදි වේ.

**සිදු කිරීමට නියමිත ව්‍යාපෘති**

**වගු අංක 47**

| අනු. අංකය | ගොඩනැගිලි වර්ගය | ප්‍රමාණය | සමස්ථ ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල (රු.මි.) | 2024 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | පොලිස් ස්ථාන ඉදි කිරීම් | 9 | 1043.47 | 445.95 |
| 2 | භට නිවාස ඉදි කිරීම් | 3 | 1016.93 | 289 |
| 3 | නිල නිවාස ඉදි කිරීම් | 3 | 645.22 | 227.35 |
| 4 | වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් | 5 | 1479.99 | 97.7 |
| 5 | පොලිස් ස්ථාන අලුත්වැඩියා කිරීම් | 8 | 327.35 | 267.57 |
| 6 | භට නිවාස අලුත්වැඩියා කිරීම් | - | - | - |
| 7 | නිල නිවාස අලුත් වැඩියා කිරීම් | 5 | 81.95 | 80.81 |
| 8 | වෙනත් අලුත්වැඩියා කිරීම් | 20 | 310.23 | 248.88 |
| **එකතුව** | | **53** | **4905.14** | **1657.26** |

**මූලාශ්‍රය -ගොඩනැගිලි කොට්ඨාසය**

vii. ස්ථාපිත කිරීමට නියමිත පොලිස් ස්ථාන, මුරකුටි, ප්‍රාදේශීය සහ ක්‍රියාකාරී කොට්ඨාස පහත පරිදි වේ.

**වගු අංක 48** **යෝජිත පොලිස් ස්ථාන, මුරකුටි, ප්‍රාදේශීය සහ ක්‍රියාකාරී කොට්ඨාස**

| අනු. අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | පොලිස් ස්ථාන | 91 |
| 2 | මුරකුටි | - |
| 3 | ප්‍රාදේශීය කොට්ඨාස | 1 |
| 4 | ක්‍රියාකාරී කොට්ඨාස | - |
| **එකතුව** | | **92** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

viii. වෙනත් භෞතික සම්පත් පහත පරිදි සපයා ගැනේ.

- විදේශීය නිල සුනඛයින් 35 දෙනෙකු මිලදී ගැනීම.
- ප්‍රමිතියෙන් යුත් සුනඛ පැටවුන් ලබා ගැනීම සඳහා විදේශීය සුනඛයින් යොදාගෙන අභිජනන කටයුතු වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකා පොලීසිය වෙත අලුතින් අශ්වයින් 15 දෙනෙකු මිල දී ගැනීම.
- දේශීයව අශ්වයින් අභිජනනය කිරීම සඳහා අශ්ව අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සහ අභිජනන කටයුතු සඳහා ඉන්දියානු වෙළඹ සතුන් දෙදෙනෙකු සහ පිරිමි අශ්වයකු මිලදී ගැනීම.
- අශ්වාරෝහක ඒකක කොළඹ, මහනුවර හා නුවරඑළිය ප්‍රදේශ වලින් ඔබ්බට වෙනත් ප්‍රදේශ කරාද ව්‍යාප්ත කිරීම.

## 2.9.5 නව තාක්ෂණය භාවිත කිරීමේ ඉදිරි ඉලක්ක.

i. කාලය හා ශ්‍රමය කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ සියල්ල අන්තර්ජාලය ඔස්සේ TEAM, ZOOM තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම දැනට ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී මෙම තාක්ෂණය භාවිතය තව දුරටත් පුළුල්ව ක්‍රියාත්මක කිරීම.

ii. විශාල වාර්තා ප්‍රමාණයක් දෛනිකව කැඳවනු ලබන ආයතනයක් ලෙස ඒවා Google forms, Microsoft forms වැනි තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කැඳවීම තුළින් කාලය හා ශ්‍රමය ඉතිරි කර ගැනීම.

iii. වෙබ් පාදක පරිගණක පද්ධති හා Cloud base තාක්ෂණය තුළින් ගොනු, ලේඛන ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන අති විශාල දත්ත ප්‍රමාණය පරිගණක වැඩසටහන් වලට ඇතුළත් කර ඉතා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සහ භෞතික ලිපි ලේඛන රහිත කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම.

iv. Microsoft 365 ගිණුම් භාවිතය පිළිබඳ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම තුළින් මහජනතාව වෙත ලබා දෙන සේවාව කාර්යක්ෂම කිරීම.

v. දිවයින පුරා පිහිටුවා ඇති අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 44 දැනට ජාලගත කර ඇති අතර, ඒ හා සම්බන්ධ ලිපි ලේඛන කටයුතු සම්පූර්ණයෙන්ම විද්‍යුත් තැපෑල මගින් සිදු කිරීම.

vi. ඇඟිලි, අතුල්, පතුල් සටහන් ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ඡායාරූපගත කිරීම මගින් එම ක්ෂේත්‍රය තව දුරටත් දියුණු මට්ටමට ගෙන ඒම සහ ඒ තුළින් අපරාධ විමර්ශන කටයුතු වේගවත් කිරීම.

vii. අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමේ දියුණු තාක්ෂණික පහසුකම් සහිත රථවාහන සහ අනෙකුත් උපාංග ලබා ගැනීම තුළින් අපරාධ විමර්ශනය සඳහා පෘතුල ලෙස සහාය වීම.

viii. ස්වයංක්‍රීය මුහුණු මගින් හඳුනා ගැනීමේ දත්ත පද්ධතියක් ජාත්‍යන්තර කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේ ස්ථාපිත කිරීම මගින් විමර්ශන කාර්යයන් සඳහා තාක්ෂණික සහය ලබා ගැනීම.

ix. සී.සී.ටී.වී ඩ්‍රෝන කැමරා ඇතුළු නවීන තාක්ෂණික පහසුකම් සහිත ජංගමරථ ලබාගෙන රථවාහන සහ අනෙකුත් ආවේක්ෂණ රාජකාරී සඳහා යෙදවීම.

x. මහජන කැලඹීම්, උද්ඝෝෂණ ආදී අවස්ථා පිළිබඳ මැනවින් අධ්‍යයනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නවීන ඩ්‍රෝන කැමරා තාක්ෂණය පුළුල් ලෙස උපයෝගී කර ගැනීම.

xi. රථවාහන වැරදි සී.සී.ටී.වී තාක්ෂණය ඔස්සේ නිරීක්ෂණය කර දඩපත්‍රිකා ලබා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

xii. වීඩියෝ පහසුකම් සහිත නවීන වේග මාපක යන්ත්‍ර සෑම පොලිස් ස්ථානයකටම ලබා දීම.

xiii. රිය අනතුරු දත්ත රැස් කිරීම සහ විශ්ලේශණය කිරීම සඳහා නිර්මාණය කර ඇති දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

xiv. පොලිස් ස්ථාන හා විවිධ විමර්ශන ඒකක මගින් සිදු කරනු ලබන අපරාධ විමර්ශන කටයුතු පහසුවෙන් කළමනාකරණය කර ගැනීම සඳහා පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම.

xv. තාක්ෂණය මත පදනම් වූ අපරාධ විමර්ශනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන නිලධරයන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම.

xvi. ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය පරිගණක පද්ධති පොලිස් නිලධරයන් ලවාම සැකසීම සඳහා අවශ්‍ය උසස් තාක්ෂණික දැනුම ලබා දීම.

දේශබන්දු තෙන්නකෝන්
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ - 01

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ඒකීය -එක් |
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය | | | | | |
| | | | තක්සේරු | | |
| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | 2023 | 2022 | |
| රු. | | | රු. | රු. | |
| - | පාදකයේ ලැබීම් | | - | - | |
| - | පාදකයේ බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒකීය -1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | - | - | |
| - | බදු නොවන පාදකයේ හා වෙනත් | 4 | - | - | |
| - | මුළු පාදකයේ ලැබීම් (ඇ) | | - | - | |
| - | පාදකයේ නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර පදනම | | 101,043,381,000 | 90,299,420,000 | ඒකීය -3 |
| - | තැන්පතු | | 718,325,931 | 347,166,682 | ඒකීය -4 |
| - | සත්කාරක බිල්පත් | | 883,621,427 | 831,937,176 | ඒකීය -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් බිල්පත් ලැබීම් | | - | 21,008 | |
| - | මුළු පාදකයේ නොවන ලැබීම් (ඈ) | | 102,645,328,358 | 91,478,544,866 | |
| - | මුළු පාදකයේ ලැබීම් සහ පාදකයේ නොවන ලැබීම් සැ = (ඇ)+(ඈ) | | 102,645,328,358 | 91,478,544,866 | |
| | භාණ්ඩාගාරයට බෙදාහැරීම්(ඉ) | | - | - | |
| | ශුද්ධ පාදකයේ ලැබීම් සහ පාදකයේ නොවන ලැබීම් ඌ = (සැ)-(ඉ) | | 102,645,328,358 | 91,478,544,866 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | ප්‍රතිව්‍යවර්තන වියදම් | | - | - | |
| 73,375,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 68,425,110,375 | 70,564,697,184 | |
| 30,495,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 31,703,119,805 | 19,463,754,881 | ඒකීය - 2(ii) |
| 760,000,000 | ගවහාණ්ඩාර, ප්‍රදාහ සහ මිරුකිරීම් | 7 | 576,245,899 | 587,247,596 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් ප්‍රතිව්‍යවර්තන වියදම් | 9 | - | - | |
| 104,630,000,000 | මුළු ප්‍රතිව්‍යවර්තන වියදම් (ව) | | 100,704,476,079 | 90,615,699,661 | |
| | මූලධන වියදම් | | | | |
| 970,000,000 | මූලධන වත්කම් ප්‍රතිව්‍යුත්පාදනය හා වැඩිදියුණු කිරීම් | 10 | 1,279,488,868 | 559,442,136 | |
| 1,945,000,000 | මූලධන වත්කම් සත්කාර කර ගැනීම් | 11 | 1,511,351,309 | 3,633,274,854 | |
| - | ප්‍රාග්ධන මිරුකිරීම් | 12 | - | - | ඒකීය - 2(ii) |
| - | මූල්‍ය වත්කම් සත්කාර කර ගැනීම් | 13 | - | - | |
| 30,000,000 | භෑණිය විරිධනය | 14 | 80,260,805 | 61,220,965 | |
| 8,805,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 10,715,783,511 | 263,810,134 | |
| 11,750,000,000 | මුළු මූලධන වියදම් (උ) | | 13,586,884,493 | 4,517,748,089 | |
| | තැන්පතු ගෙවීම් | | 759,512,032 | 1,185,465,750 | ඒකීය -4 |
| | සත්කාරක ගෙවීම් | | 939,978,605 | 815,817,214 | ඒකීය -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් බිල්පත් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 1,699,490,637 | 2,001,282,964 | |
| | මුළු වියදම් එ = (ව+උ+ඌ) | | 115,990,851,209 | 97,134,730,714 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඌ-එ) | | (13,345,522,851) | (5,656,185,848) | |
| | අවම ගනුදෙනු ප්‍රකාශනයඅනුව ශේෂය | | (13,345,522,851) | (5,656,185,848) | ඒකීය -7 |
| | දෙසැම්බර් 31 දිනට පදනම් ශේෂය | | | | ඒකීය -3 |
| | | | (13,345,522,851) | (5,656,185,848) | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ -පි


**2023 දෙසැම්බර්31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳප්‍රකාශනය**

| | සටහන | | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරිය න හා උපකරණ | ඒසිඒ-6 | | 140,638,451,745 | 58,202,144,773 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| අත්කිකාරම් ඔිණුම් | ඒසිඒ-5/5(ඒ) | | 819,868,392 | 763,726,013 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | | - | - |
| මුළු වත්කම් | | | 141,458,320,138 | 58,965,870,786 |
| **ශුද්ධ වත්කම් / ඒ කාර්යය** | | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | | 584,343,594 | 477,570,645 |
| දේපළ පිරිය න හා උපකරණ සංචිතය | | | 140,638,451,745 | 58,202,144,773 |
| කුලී හා වැඩ අත්කිකාරම් සංචිතය | ඒසිඒ-5(ඔ) | | | 9,444,469 |
| **ජංගම වගකීම්** | | | | |
| කැන්පතු ඔිණුම් | ඒසිඒ-4 | | 235,524,798 | 276,710,899 |
| අග්‍රිම ලේඛය | ඒසිඒ-3 | | - | |
| මුළු වගකීම් | | | 141,458,320,138 | 58,965,870,786 |

පිටු අංක 06 සිට 33 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 34 සිට 277 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තරගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | ඒකක -සී |
| **2023 දෙසැම්බර්31 දිනෙන්අවසන් වර්ෂයසඳහා** | | |
| **මුදල්ප්‍රවාහප්‍රකාශනය** | | |
| | සමාගම | |
| | 2023 | 2022 |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරණවලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුල බදු ලාභය | - | - |
| පොළිය, ලාභාංශ, දෙමුදල් සහ බිලපතු | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලාභ | - | 21,008 |
| වෙනත් ආදායම් ගිණුම් වෙතුවෙන් ගෙනෙනු ලබන ලද ආදායම් | 3,742,278,667 | 3,740,436,166 |
| අලුම් ලාභ | 101,043,381,000 | 90,299,420,000 |
| අක්ෂීනභාවම් අයකර ගැනීම් | 893,611,998 | 831,777,661 |
| කැන්පතු ලාභ | 718,325,931 | 347,166,681 |
| මෙහෙයුම් ක්‍රියාකාරණවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 106,397,597,596 | 95,218,821,516 |
| **අඩුකළ : මුදල් බැය කිරීම්** | | |
| පුද්ගල සේවකයි හා මෙහෙයුම් වියදම් | 99,394,341,869 | 89,501,260,477 |
| සඟහාධාර සහ ත්‍යාගකිරීම් | 195,906,773 | 510,232,162 |
| වෙනත් බැය කිරීම් වෙතුවෙන් දරන ලද වියදම් | 2,469,571,156 | 2,411,084,884 |
| හා ණ්ඩාගාරයට බිය දෙන ලද අලුම් | | 3,577 |
| අක්ෂීනභාවම් ගෙවීම් | 942,436,468 | 816,918,996 |
| කැන්පතු ගෙවීම් | 759,512,032 | 1,185,465,750 |
| මෙහෙයුම් ක්‍රියාකාරණ සඳහා බැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 103,761,768,297 | 94,424,965,846 |
| මෙහෙයුම් ක්‍රියාකාරණවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | 2,635,829,299 | 793,855,670 |
| **ආයෝජන ක්‍රියාකාරණවලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| ගිණුම් අවස්ථිකම් ප්‍රතිසංදන හා සොයාගත වස්තුවල විකිණීම් | - | - |
| උපාඟය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරණවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| **අඩුකළ : මුදල් බැය කිරීම්** | | |
| සොයාගත වස්තුවල අදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අක්ෂීනභාවම් ගැනීම් | 2,635,829,299 | 793,884,247 |
| ආයෝජන ක්‍රියාකාරණ සඳහා බැය කරන ලද මුල මුදල් ප්‍රවාහය (ඉ) | 2,635,829,299 | 793,884,247 |
| ආයෝජන ක්‍රියාකාරණවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | (2,635,829,299) | (793,884,247) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරණවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ) | 0 | (28,577) |
| **මූලා ක්‍රියාකාරණවලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්** | | |
| අදේශිය ණය ගැනීම් | - | - |
| විදේශිය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූලා ක්‍රියාකාරණවලින් ජනිත වූ මුල මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| **අඩුකළ : මුදල් බැය කිරීම්** | | |
| අදේශිය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශිය ණය ආපසු ගෙවීම් | - | - |
| මූලා ක්‍රියාකාරණ සඳහා බැය කරන ලද මුල මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූලා ක්‍රියාකාරණවලින් ජනිත වූමුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | 0 | (28,577) |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | (0) | 28,577 |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

2023.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන සකස් කොට ජාතික විගණන කාර්යාලය වෙත 2024 පෙබරවාරි මස 28 දින භාර දී ඇත. එම වාර්තාව තුළ සියලු මූල්‍ය ප්‍රකාශ සටහන් ඇතුළත් කර ඇත.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

**වගු අංක 49** **ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

| | | | | රු.,000 | |
|---|---|---|---|---|---|
| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 119,000 | 119,000 | 123,888 | 104% |
| 2002.02.99 | පොලිසිය - අනෙකුත් | 30,000 | 30,000 | 31,244 | 104% |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 125,000 | 125,000 | 178,377 | 143% |
| 2003.02.99 | විකුණුම් සහ ගාස්තු | 800,000 | 800,000 | 968,837 | 121% |
| 2004.01.00 | සමාජ රක්ෂණ දායක මුදල් | | | 2,269,805 | |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

**වගු අංක 50** **වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

| | රු.000 | | | |
|---|---|---|---|---|
| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
| පුනරාවර්තන වියදම් | 104,630,000 | 104,512,130 | 100,704,476 | 96% |
| ප්‍රාග්ධන වියදම් | 11,750,000 | 14,090,250 | 13,586,884 | 96% |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

## 3.8 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගු අංක 51

රු. 000

| අනු. අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 1 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ඉන්ධන බිල්පත් ගෙවීම | 928,265 | 928,265 | 928,265 | 100% |
| | | විදේශ ආධාර ගිණුම් තැබීම | 2,786,502 | 2,786,502 | 2,786,502 | 100% |
| 2 | ශ්‍රී ලංකා රේගුව | රේගු ගාස්තු ගෙවීම | 8,021,215 | 8,021,215 | 8,021,215 | 100% |
| 3 | රජයේ කර්මාන්ත ශාලාව | යතුරු ලියන අළුත්වැඩියාව | 10,618 | 10,618 | 10,618 | 100% |
| 4 | ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රවාහන දීමනා ඉන්දන දීමනා | 26,535 | 26,535 | 26,535 | 100% |
| 5 | විදේශ කටයුත අමාත්‍යාංශය | ජාත්‍යන්තර පොලිස් ආයතනයේ සාමාජික ගාස්තු | 22,823 | 22,823 | 22,823 | 100% |
| 6 | දුම්රිය දෙපාර්තමේන්තුව | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු | 115,092 | 115,092 | 115,092 | 100% |
| 7 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා | 284,848 | 284,848 | 284,848 | 100% |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය


වගු අංක 52 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම. |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 46,949,988 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 34,872,717 | | |
| 9153 | ඉඩම් | | 56,610,468 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 127,305 | | |
| 9154 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරිගෙන යන වැඩ | | 2,205,279 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේවල්ම/බි/පිකවල්/එස්ආර්/2023 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 30 දින

පොලිස්පති,
ශ්‍රී ලංකා පොලිසිය

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලිසියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාවගණනය කළ මතය

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලිසියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක හිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළුන් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙහි විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සොයුරේ පිළිගත් හිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහස් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශයේ 2023 ඔක්තෝබර් මස ගෙවීම් කරන ලද රු.527,520 ක් හා 2023 දෙසැම්බර් මස ගෙවීම් කරන ලද රු.37,470 ක් වූ එකතුව රු.564,990 ක අනිකාල ගෙවීම් එම මාසයන්හි මුදලින් ගෙවීම් කර තිබුණ ද විගණිත දිනය වන විටත් සිගාස් වැඩසටහනට ඇතුළත් වී නොතිබුණි. ඒ හේතුවෙන් ශ්‍රී ලංකා පොලිසියේ 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයට හා අනිකාල හා නිවාඩු දින වැටුප් වැය විෂයයට ද මෙම ශේෂය ඇතුළත් වී නොතිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.820,083,191 ක් වූ අතර, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.741,315,718 ක් විය. ඒ අනුව රු.78,767,473 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 5 - 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ශේෂය රු.820,083,191 ක් ද, භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ශේෂය රු.819,868,392 ක් ද වූයෙන් රු.214,799 ක වෙනසක් විය.

### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

ACA – 6 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.140,765,756,448 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම තුළ අස්පෘශ්‍ය වත්කම් වටිනාකම ඇතුළත් නොවීම නිසා රු.140,638,451,745 ක් ලෙස දක්වා තිබූ අතර ශේෂ දෙක අතර වෙනස රු.127,304,703 ක් විය .

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි | නිරීක්ෂණ |
|---|---|---|---|
| (I) | ස්ථාවර වත්කම් ලේඛනය | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය | සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් පොලිස් කොට්ඨාශ වාර්තා ඒකාබද්ධ කර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (II) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 94(2),(3) | මුදල් රෙගුලාසි පරිදි බැරකම් සම්බන්ධයෙන් විධිමත් පරිදි පිළියෙල කරන ලද බැරකම් ලේඛනයක් පිළියෙල කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) 225-1-1-0-2505 - ප්‍රසම්පාදන පෙර සූදානම් වීම හා 225-1-1-0-2509 - සුනඛයින් මිලදී ගැනීම යන වැය විෂයයන් දෙක සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන එකතුව රු.60,000,000 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ආ) 2023 වර්ෂයේදී වැය විෂයයන් හතරක් සඳහා ප්‍රතිපාදිත රු.87,000,000 කින් රු.56,024,232 ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය සියයට 49 සිට සියයට 100 ක් දක්වා පරාසයක විහිදී තිබුණි.

(ඇ) 2023 ජනවාරි 27 දිනැති අයවැය වක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායි ලෙස භාවිතා කිරීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීමේ අරමුණින් 2023 වසර සඳහා අයවැය මඟින් වෙන්කර ඇති පුනරාවර්තන වියදම් අවම වශයෙන් සියයට 6 කින් කපා හැරීමට අමාත්‍ය මණ්ඩල විසින් තීරණය කර ඇති බවත්, ඒ අනුව 1001, 1204, 1404, 1502, 1601, 1602 හා 1603 හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු බව දැනුම්දී තිබුණි. ශ්‍රී ලංකා පොලිසියේ වැය විෂයන් 11 ක පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව පොලිස් කොට්ඨාශ 09 ක බැංකු ගිණුම් 09 කට අදාළව තැන්පත් කළ නමුත්, බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ රු.935,524 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.3 **තැන්පතු**

(අ) 2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබාදී තිබුණු රු.45,837,000 ක පරිත්‍යාග මුදලින් ඉතිරිව පවතින රු. 11,503,192 ක මුදලක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර, ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවීය.

(ආ) මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි 570 පරිදි රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද, තැන්පතු ගිණුම් 5 ක රු.135,565,883 ක තැන්පතු එසේ ආදායමට බැර නොකර රඳවාගෙන තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

3.1.1 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

දඩ මුදල් අය කරගැනීම වෙගවත් කිරීමත්, රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථවාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System) ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතිය ද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිතව නොතිබුණි.

3.1.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

(අ) බල අපරාධ වාර්තා වීම හා විසඳීම

I. බරපතල තුවාල සිදු කිරීම හා මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ ගත්විට 2018 - 2022 කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 1431, 1373, 1356, 1375 හා 1482 වශයෙන් වාර්තා වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ඉහළම අගය වූ 2,030 ක් වාර්තා වී තිබුණි. 2023 වර්ෂයේ මුල් මාස 10 තුළ වාර්තා වී තිබූ මනුෂ්‍ය ඝාතන 488 න් 52 ක් වෙඩි තැබීමෙන් සිදුව තිබූ මනුෂ්‍ය ඝාතන වේ. තංගල්ල, නුගේගොඩ, ගම්පහ, රත්නපුර හා ඇල්පිටිය යන පොලිස් කොට්ඨාශ 05 තුළ පිළිවෙලින් 32, 27, 24,

24 හා 20 වශයෙන් මනුෂ්‍ය ඝාතන ඉහළ සංඛ්‍යාවක් වාර්තා වී තිබිණි. "මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම" හා "අපරාධ පාලනය හා වැළැක්වීම" ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන කාර්යයන් 08 න් 02 ක් වන බැවින් රට තුළ සිදුවන මෙම බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු ව පැවතුණි.

II. ගෙවල් බිඳීම හා කොල්ල කෑම යන බල අපරාධ ගත්විට පසුගිය වසර 06 ක කාලපරිච්ඡේදය තුළ වැඩිම සංඛ්‍යාවක් වාර්තාවී තිබුණේ 2023 වර්ෂයේදී විය. ගෙවල් බිඳීමේ බල අපරාධය සම්බන්ධයෙන් ගත් විට 2018 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ වාර්තා වීම සියයට 50 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ගෙවල් බිඳීම හා කොල්ල කෑම යන බල අපරාධ විසඳීම ගත්විට පසුගිය වසර 06 තුළ අඩුම විසඳීමේ ප්‍රතිශතයක් වාර්තා වී තිබුණේ 2023 වර්ෂයේදී විය. ගෙවල් බිඳීම විසඳීමේ ප්‍රතිශතය 2018 දී සියයට 60 ක් ව පැවතියද, 2023 දී සියයට 50 දක්වා පහත වැටී තිබුණි. කොල්ල කෑම විසඳීම 2018 දී සියයට 75 ක්ව පැවතිය ද 2023 දී සියයට 61 දක්වා අඩුවී තිබුණි.

(ආ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තා වීම පිළිබඳව

2020-2023 කාලපරිච්ඡේදයේ කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම පිළිවෙලින් 595, 568, 600 හා 759 වශයෙන් විය. 2022 වර්ෂයට සාපේක්ෂව කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම 2023 වර්ෂයේදී සියයට 27 කින් වැඩිවී තිබූ අතර, ඒ අතර දූෂණ සංඛ්‍යාව 182 සිට 226 දක්වා ද, බරපතල තුවාල සිදු කිරීම් සංඛ්‍යාව 154 සිට 221 දක්වා ද, පිහි ආදියෙන් තුවාල සිදු කිරීම් සංඛ්‍යාව 74 සිට 96 දක්වා ද, බරපතල ලිංගික අපයෝජන සංඛ්‍යාව 21 සිට 37 දක්වා ද වැඩි වී තිබීම කැපී පෙණුනි. 2023 වර්ෂයේදී මෙම අපරාධ විසඳීම සියයට 99 ක ප්‍රගතියක් පෙන්නුම් කළ ද අපරාධ වාර්තා වීම වැඩි වී ඇති බැවින් ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන කාර්යයන් අතරින් එකක් වන "අපරාධ පාලනය හා වැළැක්වීම" පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතුව පැවතුණි.

### 3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

2016 වර්ෂයේදී පමණ ආරම්භකර තිබූ කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිල නිවාස ඉදිකිරීම, රථ වාහන මූලස්ථානය ඉදිකිරීම, වැලිගම පොලිස් ස්ථානය ඉදිකිරීම සහ කොල්ලුපිටිය, කුරුදුවත්ත, තිරුක්කෝවිල්, මල්ලාවි හා නාරාහේන්පිට පොලිස් ස්ථානවල වැඩ අවසන් කිරීම

යන ප්‍රමාද වූ ව්‍යාපෘති 08 සඳහා මුළු ඇස්තමේන්තු වියදම රු. මිලියන 1,903.35 ක් ද, 2022.12.31 දිනට මුළු වියදම රු. මිලියන 985.57 ක් ද විය. 2023 වර්ෂයේ රු. මිලියන 299 ක් ප්‍රතිපාදන සලසාදී තිබුණ ද වියදම රු. මිලියන 133.81 ක් පමණක් විය. ඉදිකිරීම් ප්‍රමාද වූ මෙම ව්‍යාපෘති 08 හි වර්තමාන ප්‍රගතිය ද මන්දගාමීව පැවතීම නිසා ව්‍යාපෘති ආරම්භක අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) හබරාදුව "නිල සෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් රු. මිලියන 729.6 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර, මෙම නිල නිවාස අවශ්‍යතාවය හා ඉල්ලුම පිළිබඳ නිවැරදි අධ්‍යනයක් සිදු නොකර මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබුණි. 2024 අප්‍රේල් මාසය වන විටත් මෙම නිවාස පවරා ගැනීම අවසන්ව නොතිබූ අතර, ගෙවන ලද රු.මිලියන 500 ට ප්‍රමාණවත් නිවාස සංඛ්‍යාවක් පමණක් පවරා ගැනීමට යෝජනා වී තිබුණ ද ඒ සඳහා ද අවසන් එකඟතාවක් ඇතිව නොතිබූ අතර, පවරා ගැනීමට යෝජිත නිවාසයන්හි ඉදිකිරීම්වල අඩුපාඩු පවතින බවට හඳුනාගෙන තිබුණි.

(ආ) රථවාහන හැසිරවීමේ රාජකාරී සඳහා අවශ්‍ය බවට හඳුනාගෙන පොලිස් රථවාහන මූලස්ථානය විසින් ඉල්ලුම්කර තිබූ ශබ්දය මැනීමේ උපකරණ (Sound Testing Meter) අදුරු විදුරු මැනීමේ උපකරණ (Transmission and Reflection Meter) රතු විදුලි පන්දම් (Red Torch Lights) හා රථ වාහන කේතු - ලොකු (Traffic Cones – Large) යන උපකරණ මිලදී ගැනීමට පොලිසියේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රමුඛතාවය ලබාදී නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ශ්‍රී ලංකා පොලිසියට පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණ ද 2023 දෙසැම්බර් මාසය වන විටත් අවසන්ව නොතිබුණි.

i. පොලිස් අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට යෝජිත අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක ප්‍රමාණයකින් යුත් මල්වානේ පිහිටි ඉඩම

ii. පොලිස් අශ්වාරෝහක කොටියාශය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75 ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩම

(ආ) ඉංගිරියේ උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ වැඩ ආරම්භ කර රු. මිලියන 8.8 ක් වැයකර ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් මස එකක් රු. මිලියන 3.3 බැගින් රු. මිලියන 333 කට ගාල්ල, වැකුණගොඩ "නිල සෙවන" නිවාස ව්‍යාපෘතියෙන් මිලදී ගත් නිවාස 100 ට අදාළ පැවරුම් ඔප්පු 2023 මාර්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඈ) ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අත්තිඩියේ පිහිටි ඒකකයට අයත් භූමියේ පෙරසව් ගොඩනැගිලි 05 ක් සමඟ අක්කර 6 ක පමණ භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ හට පිරිස්වලට නවාතැන් ගැනීම සඳහා තාවකාලික 2019 වර්ෂයේදී ලබාදී තිබුණි. එම පරිශ්‍රයේ ජල හා විදුලි බිල්පත් ශ්‍රී ලංකා පොලිසියට වැය බරක් වී තිබුණි. වසර 05 ක් පමණ ගතවී ඇතත්, එම භූමිය ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රයෝජනය සඳහා පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) කටාන ජාතික පොලිස් විද්‍යාලයේ නේවාසික පහසුකම් ලබාදීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 අගෝස්තු 20 දින ලංසු ප්‍රධානය කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදුවීම නිසා 2023 අප්‍රේල් 26 දින ඉදිකිරීම් අත්හිටුවා තිබූ අතර, ඉටුකර ඇති වැඩවල වටිනාකම රු. 97,290,003 ක් පමණක් බවට උපදේශක ආයතනය තීරණය කර තිබූ අතර, ඒ අනුව රු.42,252,164 ක් නැවත අයවීමට තිබුණ ද, එය අයවී නොතිබුණි. ගොඩනැගිල්ලේ අත්තිවාරමේ හා කොන්ක්‍රීට් තට්ටුවල (Slab) පිටතට නෙරා ඇති යකඩ

කම්බි මල බැඳී දිරාපත් වෙමින් පැවති අතර, වැඩබිමේ තිබූ රු.1,744,875 ක් පමණ වටිනා කම්බි තොගයක්ද මල බැඳී දිරාපත් වෙමින් පැවතුණි.

(ඊ) කටාන ජාතික පොලිස් විද්‍යාලයේ යෝජිත අධ්‍යාපන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංශෝධිත මුළු පිරිවැය රු.224,616,490 ක් වූ අතර, 2018 අගෝස්තු 07 දින ලංසු ප්‍රදානය කර තිබුණි. සැලසුම් දෝෂයක් හේතුවෙන් පඩිපෙළ සම්පූර්ණයෙන් කඩා ඉවත්කිරීමට සිදුව තිබූ අතර, ඒ සඳහා රු.687,181 ක් වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබුණි. මෙම තත්ත්වය මත ව්‍යාපෘතියට සිදුවන අමතර වියදම් හා ප්‍රමාදය පිළිබඳ වගකීම භාරගන්නා පාර්ශවය පිළිබඳ තොරතුරු නොලැබුණි.

(උ) පොලිස් අභ්‍යාස අයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවනාගාරය සඳහා රු.6,547,992 ක් වැය කර 2021 දෙසැම්බර් 23 දින භාෂා පරිවර්තන පද්ධතියක් මිලට ගෙන ඇති නමුත්, 2023 දෙසැම්බර් මාසය වන විටත් මෙම භාෂා පරිවර්තන පද්ධතිය නිශ්කාර්යව පැවතුණි.

## 3.4 අනාර්ථික ගනුදෙනු

ද්විත්ව මනුෂ්‍ය ඝාතනයට අදාළව සිදුකරන ලද පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු මත 2019 වර්ෂයේදී පොලිස් නිලධාරීන් 15 දෙනෙකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර තිබුණි. පසුව එම නිලධාරීන්ගේ කලත්‍රයන් විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කිරීම මත ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2022 පෙබරවාරි 25 ලබාදී තිබූ නියෝගය මත කළුතර පොලිස් කොට්ඨාශයට අනුයුක්තව සිටි පොලිස් නිලධාරීන් තිදෙනෙකුගේ කලත්‍රයන් වෙත එකතුව රු.4,741,056 ක් අඩවැටුප් ලෙස 2023 නොවැම්බර් වන විට ගෙවා තිබුණි. මෙම ද්විත්ව ඝාතනයට අදාළ පරීක්ෂණ, අධිකරණ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය හා සෙසු නිලධාරීන්ට ගෙවනු ලබන අඩවැටුප් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවූ අතර, මෙලෙස සැකකරුවන් ලෙස චිමර්ශන මඟින් හඳුනාගත් නිලධාරීන්ගේ කලත්‍රයන් වෙත දීර්ඝකාලීනව අඩවැටුප් ගෙවීම වැරදි පූර්වාදර්ශයක් විය හැකි බැවින් සුදුසු තීරණයක් ගැනීම සඳහා පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇති බවට කරුණු අනාවරණය නොවුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) රාජ්‍ය ආයතනවල උසස් තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමට පෙර එම නිලධාරියා හා ඔහුගේ සමීප ඥාතීන් සම්බන්ධයෙන් හා ඔවුන්ගේ චර්යාවන්ට අදාළ පසුබිම් වාර්තා අදාළ පොලිස් ස්ථාන වෙතින් ලබාගැනීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. එලෙස අදාළ පොලිස් ස්ථානවලින් එම රාජ්‍ය ආයතන වෙත ලබාදෙන තොරතුරු වලට අදාළ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය මෙතෙක් අනුගමනය කර ඇති ක්‍රියා පටිපාටී පිළිබඳව තොරතුරු විගණනයට හෙළිදරව් නොවූ බැවින් ඒ සඳහා හඳුන්වා දුන් චක්‍රලේඛ හෝ මාර්ගෝපදේශ ඇති බවට හා පොදු ක්‍රමවේදයක් අනුගමනය කරන බවට විගණනයට සාක්ෂි නොලැබුණි.

(ආ) රථවාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ අවසන් වරට මිලදීගෙන තිබුණේ 2016 වර්ෂයේදී වූ අතර මිලදී ගත් ප්‍රමාණය 25 ක් පමණක් විය. ඊට පෙර 2014 වර්ෂයේදී 30 ක් ද, 2010 දී 100 ක් ද, මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ අතරින් ද විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. 2018 – 2023 කාලපරිච්ඡේදයේ වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර (Automatic Speed Trap) 500 බැගින් රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් ඉල්ලුම් කර තිබුණ ද එයින් කොටසක් හෝ මිලදී ගෙන නොතිබුණි. ඒ අනුව වේග සීමා කඩකරමින් අධික වේගයෙන් රථවාහන ධාවනය කිරීම, රථවාහන අනතුරු සිදුවීමට ප්‍රධාන හේතුවක් වන නමුත් එය අවම කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියා කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පොලිසිය මගින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව තවදුරටත් පවත්වාගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභාවීම් වූ නඩු හා සැකකරුවන් වරදකරුවන් වූ හෝ සැකකරුවන් නිදහස් වූ යනාදී වශයෙන් විස්තර ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය කැපී පෙනෙන අතර, ශ්‍රී ලංකා පොලිසියේ කාර්යසාධනය පිළිබඳව සමාලෝචනයේදී එවැනි පද්ධතියක අවශ්‍යතාවය වැදගත් වන නමුත් එවැනි පද්ධතියක් පවතින බව සනාථ නොවී ය.

(ඇ) ගම්පහ පොලිස් කොට්ඨාශයට අයත් නිලධාරියෙක් චෝදනාවට ලක්වීම මත 2018 අප්‍රේල් 18 දින සිට වැඩ තහනමට ලක්ව තිබූ අතර, එම නිලධාරියාට 2008 සැප්තැම්බර් මස සිට 2022 ජනවාරි දක්වා රු.3,251,000 ක් අඩ වැටුප් ලෙස ගෙවා තිබුණි. 2022 ඔක්තෝබර් මස මෙම නිලධාරියා අදාළ චෝදනාවට අධිකරණයෙන් වරදකරු වීම මත ගෙවන ලද අඩවැටුප් වටිනාකම අය කර ගැනීමට නොහැකිව තිබූ අතර, අඩ වැටුප් ගෙවීමට ගනු ලැබූ තීරණයේ නිවැරදිතාවය පිළිබඳව ද ගැටළු පැවතුණි.

(ඉ) ප්‍රභූ ආරක්ෂාව සැලසීමට අදාළ පොලිස්පතිගේ 2020 සැප්තැම්බර් 30 දිනැති අංක 2687/2020 දරන චක්‍රලේඛයට පරිබාහිරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙන ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ කමිටුව මඟින් හිටපු ආණ්ඩුකාරවරුන්, හිටපු මන්ත්‍රීවරුන්, හිටපු ප්‍රධාන අමාත්‍යවරුන්, ආගමික නායකයන් හා වෙනත් ප්‍රභූන් වශයෙන් විවිධ තැනැත්තන් සඳහා මෙන්ම ඉහත චක්‍ර ලේඛනයේ නියමයන් යටතේ ප්‍රභූ ආරක්ෂාව සැලසිය හැකි ප්‍රභූන් වෙත ද අනුමත සීමාව ඉක්මවා ප්‍රභූ ආරක්ෂකයින් වසර ගණනාවක් අඛණ්ඩව අනුයුක්තකර සිටින අවස්ථා පැවති අතර, ඒ සඳහා පවතින නෛතික ප්‍රතිපාදන කවරේ ද යන්න විගණනයට අනාවරණය නොවුණි. ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශය යටතේ ඇති පොලිස් කොට්ඨාශ 09 ක් සඳහා 2022 ජනවාරි 01 දිනට නිලධාරීන් 3,884 ක් අනුයුක්ත කර සිටියද 2023 සැප්තැම්බර් 30 දින වන විට අනුයුක්ත නිලධාරීන් සංඛ්‍යාව 4,859 ක් දක්වා වැඩිකර තිබුණි. 2018 – 2022 කාලපරිච්ඡේදයේ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශයේ වාර්ෂික සාමාන්‍ය වියදම රු.මිලියන 4,342 ක් වුවද, ඉහත කරුණුවල සෘජු බලපෑම නිසා 2023 වර්ෂයේ කොට්ඨාශයේ වියදම රු. මිලියන 5,833 දක්වා වැඩිවී තිබුණි. මේ අනුව ඉහත චක්‍රලේඛයට පරිබාහිරව අනුයුක්ත කර සිටින නිලධාරීන් වෙනුවෙන් ගෙවා ඇති වැටුප් හා දීමනා වියදම (විශේෂ දීමනාව ඇතුළු) පිරිමැසුම්දායක නොවන වියදම් බව නිරීක්ෂණ විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 2,458 ක ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.60,874,303 ක් වූ අතර, එම ණයශේෂ තුළ වර්ෂ 05 ට වැඩි නිලධාරීන් 1,590 ක ගේ හිඟ හිටි ණයශේෂවල එකතුව රු.41,743,898 ක් විය.

(උ) 2022 වර්ෂයේදී ප්‍රජා පොලිස් උපදේශක සභා රැස්වීම් 7,224 ක් පැවැත්විය යුතු වුවත්, පවත්වා තිබූ සංඛ්‍යාව 4,620 ක් පමණක් වූ අතර, 2023 වර්ෂයේදී පැවැත්විය යුතු රැස්වීම් සංඛ්‍යාව 6,020 ක් වුවත්, පවත්වා තිබුණේ 3,848 ක් පමණි. පොලිස් ස්ථාන මට්ටමින් ප්‍රජා පොලිස් උපදේශක සභාව 2022 වර්ෂයේදී 12 වතාවක් රැස්විය යුතු අතර, එය

රැස්වීමේ ප්‍රගතිය සියයට 64 මට්ටමේ විය. 2023 වර්ෂයේදී රැස්විය යුතු වාර ගණන 10 ක් දක්වා අඩු කළ ද මෙම උපදේශක සභාව රැස්වීමේ ප්‍රගතිය සියයට 64 මට්ටමේ විය.

(උ) ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් 7,224 ක් හා 6,020 ක් පැවැත්විය යුතු වුවත්, 4,523 ක් හා 3,847 ක් පමණක් පවත්වා තිබුණි. පොලිස් ස්ථාන මට්ටමින් ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම 2022 වර්ෂයේදී 12 වතාවක් සිදුවිය යුතු වුව ද, කමිටු පැවැත්වීමේ ප්‍රගතිය සියයට 63 මට්ටමේ විය. 2023 වර්ෂයේදී කමිටු පැවැත්වීම අවස්ථා 10 දක්වා අඩුකර තිබුණු අතර, ඒ අනුව කමිටු පැවැත්වීමේ ප්‍රගතිය සියයට 69 ක් දක්වා සුළු වශයෙන් පමණක් වර්ධනය වී තිබුණි.

(ඵ) 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. සංශෝධන සිදු කළ යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද, 2024 අප්‍රේල් මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි.

(ඒ) 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදු කරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදු කරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අය කරගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) පැලියගොඩ ලිපි ද්‍රව්‍ය ගබඩාවේ 2023 ජූනි 22 දින සිදුකර තිබූ භෞතික තොග ගණනයේදී භාණ්ඩ අයිතම 72 කට අයත් ඒකක 60082 ක ඌණතාවයක් ද, භාණ්ඩ අයිතම 45 කට අයත් ඒකක 9846 ක අතිරික්තයක් ද හඳුනාගෙන තිබූ නමුත්, මේ සම්බන්ධ වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමක් හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමක් සිදුව නොතිබුණි. මෙදින පැවති භෞතික තොග ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙස ගෙන නව තොග පොතක් ආරම්භ කර පවත්වාගෙන ගොස් තිබුණි.

04. **මානව සම්පත් කළමනාකරණය**

4.1 **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

පොලිසියේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දිනට නිල ඇදුම් කාර්ය මණ්ඩලය, සහායක සේවය හා සිවිල් කාර්ය මණ්ඩලයේ මුළු අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 924 | 622 | 302 | - |
| (ii) | තෘතීයික මට්ටම | 4,381 | 4,385 | 285 | 289 |
| (iii) | ද්විතීක මට්ටම | 101,849 | 79,997 | 21,984 | 132 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 7,513 | 4,323 | 3,317 | 127 |
| | එකතුව | 114,667 | 89,327 | 25,888 | 548 |

(අ) පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානවල අනුමත වූ කාර්ය මණ්ඩලයක් නොතිබීම.

පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරී ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි.

(ආ) පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 60,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 30,909 ක් පමණක් වීම මත පුරප්පාඩු 29,091 ක් පැවතුණි. අනුමත සංඛ්‍යාව නොසලකා උසස්වීම් ලබාදීමට, ලබාදී තිබූ අනුමැතිය මත 2019 හා 2020 වර්ෂවල ලබා දුන් උසස්වීම් හේතුවෙන් පොලිස් සැරයන් තනතුරේ 10,900 ක අතිරික්ත සංඛ්‍යාවක් සිටින අතර, එම අතිරික්ත සංඛ්‍යාව පොලිස් කොස්තාපල් පුරප්පාඩු සංඛ්‍යාවෙන් අඩුකළ ද පොලිස් කොස්තාපල් තනතුරේ තවදුරටත් පුරප්පාඩු 18,191 ක් පැවතුණි. මෙලෙස පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාවෙන් සියයට 30 ක

පමණ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම, ශ්‍රී ලංකා පොලිසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටු කිරීමේදී බාධාවක් වී තිබුණි.

(ඇ) කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 10,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 5,980 ක් පමණක් වීම මත පුරප්පාඩු 4020 ක් පැවතුණි. අනුමත සංඛ්‍යාව නොසලකා උසස්වීම් ලබාදීමට ලබාදී තිබූ අනුමැතිය මත 2019 හා 2020 වර්ෂවල ලබාදුන් උසස්වීම් හේතුවෙන් කාන්තා පොලිස් සැරයන් තනතුරේ 645 ක අතිරික්ත සංඛ්‍යාවක් සිටින අතර, එම අතිරික්ත සංඛ්‍යාව කාන්තා පොලිස් කොස්තාපල් පුරප්පාඩු සංඛ්‍යාවෙන් අඩු කළ ද, කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ තවදුරටත් පුරප්පාඩු 3,375 ක් පැවතුණි. මෙලෙස කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාවෙන් සියයට 34 ක පමණ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම, ශ්‍රී ලංකා පොලිසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටු කිරීමේදී බාධාවක් වී තිබුණි.

